ජාත්‍යන්තර සාම ඇකඩමිය

SAFERWORLD



# ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක් තුලින් පොලිස් ප්‍රතිසංස්කරණ

## ක්‍රියාත්මක කිරීම සඳහා දර්ශනය සහ උපදෙස්

හෙස්ටා ග්‍රෝන්වෝල්ඩ් සහ ගෝර්ඩන් පීක්

2004 සැප්තැම්බර් ■ නිව් යෝර්ක්

# ස්තුතිය

අන්තර් ජාතික සාම ඇකඩමිය සහ සේෆර්වර්ල්ඩ් ආයතනය ඒකාබද්ධව 2004 මාර්තු 22 සහ 23 දෙදින තුල නිව්යෝර්ක් නගරයේදී මෙහෙයවූ ''ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව : ආරක්ෂාව වර්ධනය කිරීම - වර්ධනය ආරක්ෂා කිරීම, නම් වූ සම්මන්ත්‍රණයේදී සාකච්ඡා කළ කරුණු පාදක කර ගනිමින් මෙම වාර්තාව සකස් කොට තිබේ.

මෙම ලේඛනයේ මෙයට පෙර සැකසූ කෙටුම්පත පිළිබඳව සිය අගනා අදහස් දැක්වීම වෙනුවෙන්, මාර්ක් බැස්කින්, රෙනාටා ඩ්වේන්, ක්‍රිස් ගේල්, ඒඩ්‍රියන් හෝන්, නීල් ජාමන්, ඔට්වින් මැරේනින්, ඇන්ඩි මැක්ලීන්, රචෙල් නීල්ඩ් සහ ලුක් වෑන් ඩි ගෝර් යන අයට මෙම ලේඛනයේ කතෘවරු සිය ස්තුතිය පල කරති. එසේම සංස්කරණය හා සම්බන්ධව අදහස් පළ කළ ක්ලේරා ලී, ෆ්‍රැන්සෙස්කෝ මන්සීනි සහ නෙක්ලා ත්ස්චිර්ගි වෙතටද ඔවුහු තම ස්තුතිය පුද කරති.

සම්මන්ත්‍රණය සඳහාත් වැඩ මුළුවේ මුල් වාර්තාව සඳහාත් මූල්‍ය ආධාර සැපයූ විදේශ කටයුතු සහ අන්තර් ජාතික වෙළඳාම පිළිබඳ කැනේඩියානු දෙපාර්තමේන්තුව ( DFAIT ) අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. එසේම රැස්වීම් සඳහා අනුග්‍රහය දැක්වීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ කැනඩා දූත මණ්ඩලයටද, එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ලක්සෙම්බර්ග් දූත මණ්ඩලයටද අපි ස්තුතිවන්ත වෙමු.

වැඩ මුළුවේ මුල් වාර්තාව පල කරන විට අන්තර් ජාතික සාම ඇකඩමියේ ආරක්ෂාව - සංවර්ධනය අතර සහ-සම්බන්ධය වැඩ සටහනට අරමුදල් සපයන ලද්දේ, රොකෆෙලර් පදනම, සහ ඕස්ට්‍රේලියාව, කැනඩා DFAIT සහ CIDA සහ ජර්මන්, ලක්සෙම්බර්ග්, නෝර්වේ සහ එක්සත් රාජධානියේ(DFID) රජයන් විසිනි. එමෙන්ම ඩෙන්මාර්ක්, ස්වීඩන් සහ ස්විට්සර්ලන්ත රජයන් වෙතින් මෙන්ම ෆෝර්ඩ් පදනම සහ විලියම් හා ෆ්ලෝරා හෙව්ලෙට් පදනම වෙතින්ද ලද ප්‍රධාන සහයෝගය අන්තර් ජාතික සාම ඇකඩමියේ ආරක්ෂාව - සංවර්ධනය අතර සහ-සම්බන්ධය වැඩ සටහනට මහත් රුකුලක් විය.

සේෆර්වර්ල්ඩ්, ප්‍රජාවන්ට සාමකාමී සහ ඵලදායී ජීවිත ගත කරනු පිණිස සන්නද්ධ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සහ සුරක්ෂිත ප්‍රජාවන් ඇති කිරීම සඳහා ක්‍රියාකරන ස්වාධීන සංවිධානයකි. එහි දේශීය හවුල්කරුවන් ඵලදායී හා චිරස්ථායී කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් සවිබලගැන්වීම අරමුණු කර සිටී.

සේෆර්වර්ල්ඩ්: රජයයන්, අන්තර්ජාතික, කලාපීය හා දේශීය සංවිධාන ගණනාවක් සමග වැඩසටහන් සංවර්ධනය කොට දියත් කරයි. සුරක්ෂිත ප්‍රජාවන් ඇති කිරීමට පර්යේෂණ, පුහුණු හා අධිවාචනය (advocacy) ක්‍රියා සංකලනය මගින් සමෝධානිත ආරක්ෂක අංශ සංවර්ධනය සහ නීතිමය පිවිසුම් උපායමාර්ග සංවර්ධය එහි මූලික කාර්යයකි. සේෆර්වර්ල්ඩ්, අප්‍රිකාව, යුරෝපය සහ දකුණු ආසියාවේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි. තොරතුරු සඳහා- www.saferworld.org.uk

එක්සත් රාජධානියේ ජගත් අවි ගැටුම් වැලැක්වීමේ සංචිතය විසින් ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය හරහා සේෆර්වර්ල්ඩ් ආයතනයේ ශ්‍රී ලංකා වැඩසටහනට ලබා දුන් සහාය සමගින් මෙම සිංහල සහ දෙමළ ප්‍රකාශන පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කරන ලදි.

## කතුවරුන් පිළිබඳව

හෙස්ටා ග්‍රෝන්වෝල්ඩ්, ලන්ඩන්හි සේෆර්වර්ල්ඩ් ආයතනයේ ගැටුම් වැලැක්වීමේ වැඩ සටහනේ වැඩ සටහන් නිලධාරිනියකි. ඇය අප්‍රිකාව තුල ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා - ගැටුම් වැළැක්වීම සහ සාමය ගොඩ නැගීමේ ගැටළු ගැන පුළුල් ලෙස කටයුතු කළ අයෙකි.

ගෝර්ඩන් පීක්, නිව් යෝර්ක් හි පිහිටි අන්තර් ජාතික සාම ඇකඩමියේ "ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණ" පිළිබඳ වැඩ සටහන් සම්පාදකවරයෙකි. ඔහු තම ආචාර්ය උපාධිය ඔක්ස්ෆර්ඩ් හි ශාන්ත අන්තෝනි විදුහලෙන් ලබා ගත් අතර එහිදී ඔහු කොසෝවෝ සහ පලස්තීන පාලන ප්‍රදේශවල පොලිස් ආයතන ගැන නිබන්ධනයක් සැකසීය. ඇල්බේනියාව, කොසෝවෝ සහ ඉන්දුනීසියාවෙහි ඇති පොලිස් සේවාව හා බැඳුණු ගැටළු ගැන ඔහු සේෆර්වර්ල්ඩ් සංවිධානයට සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලට (UNDP) උපදෙස් සපයා තිබේ.

කවරයේ ඡායාරූපය :- සියෙරා ලියොන් පොලිසියේ පුහුණුව අවසන් කර විසිර යාමේ අවස්ථාව, මෙම ඡායාරූපය ප්‍රතිනිෂ්පාදනය කිරීමට අපට කාරුණික අවසරය ලබා දුන් ඒඩ්‍රියන් හෝර්න් ට අපගේ ස්තුතිය.

# පටුන


සාරාංශය .......... i

1 හැඳින්වීම .......... 1

2 ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව පොලිස් ප්‍රතිසංස්කරණ ආකෘතියක් වශයෙන් .......... 2

3 ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව - නීතිය සහ සාමය පවත්වා ගෙන යාම පමණක් නොව .......... 3

4 පොලිස් ප්‍රතිසංස්කරණවල දුෂ්කරතා පිළිබඳව උගත් පාඩම් .......... 5

5 ක්ෂෙත්‍රයේ අත්දැකීම් : ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව භාවිතාවට නැගීම .......... 7

6 ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව : ක්‍රියාවට නැංවීමේ රාමුවක් .......... 10

(අ) ප්‍රධාන මූලධර්ම 11

(ආ) සාර්ථකත්වයේ තීරණාත්මක සාධක 11

(ඇ) ක්‍රියාවට නැගීමේ ආකෘතිය 12

7 සමාලෝචනය .......... 21

වැඩ මුළු න්‍යාය පත්‍රය .......... 22

සහභාගිවූවන්ගේ ලේඛනය .......... 23

## සාරාංශය

පොලීසිය ප්‍රතිසංස්කරණයට ලක් කිරීම යනු ගැටුම් කළමනාකරණයේ එක් මූලික අංගයක්ය යන පිළිගැනීම වඩ වඩාත් වර්ධනය වෙමින් පවතී. ප්‍රජාවගේ සහයෝගය ලබන සහ අනාරක්ෂිත භාවය දුරු කිරීමට හැකියාව ඇති පොලිස් සේවාවක්, කල් පවත්නා ආර්ථික, සමාජීය වර්ධනයන් සඳහා දිගුකාලීන බලපෑමක් එල්ල කරයි පොලිස් ප්‍රතිසංස්කරණ හරහා ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය, නීතියේ ආධිපත්‍යය සහ යහපාලනය යන ක්ෂේත්‍රවල වෙනත් වැඩ සටහන්වලටද මග පාදා දීම සහ දිරිගැන්වීම සිදු කල හැකිය. පොලීසිය ප්‍රතිසංස්කරණයට ලක් කිරීමට දරණ උත්සාහයන් සහ පොලිස් සේවා කටයුතු අභිවෘද්ධියට ලක් කිරීමට බාධා පමුණුවන, දේශපාලනික මූල්‍යමය බාධකද, පහසුකම් සැපයීම පිළිබඳ බාධකද,ඓතිහාසික බාධකද තිබේ. එහි සංකීර්ණත්වය කෙතරම් පුළුල්ද යත්; එය කළමනාකරණය, නායකත්වය, දේශපාලන අධිෂ්ඨානය, ආකල්ප, ස්ථාපිත චර්යා රටා සහ නිශේධනාත්මක මහජන ආකල්ප ආදී ගැටළු ගණනාවක් හා සම්බන්ධ වේ.

එහෙත්, එය ඉතා වැදගත් වන බැවින් එය බැහැර කිරීමට නොහැකිය. නිරන්තරයෙන් පුළුල් වන ක්‍රියාකාරිකයින් සමූහයක් විසින් පොලිස් ප්‍රතිසංස්කරණ සිදු කරන බැවින්, පොලිස් ප්‍රතිසංස්කරණ සමන්විත වන්නේ කුමකින්ද යන්න සහ එය සිදු කළ යුත්තේ කෙසේද යන්න ගැන පැහැදිලි අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය වේ.

පොලීසිය ප්‍රතිසංස්කරණය කිරීම සහ ඔවුන්ගේ මහජන ප්‍රතිරූපය යලි වර්ධනය කිරීමද, ප්‍රජාව පදනම් කර ගත් ප්‍රවේශයන් තුළින් විශේෂයෙන් අවධානයට යොමු කෙරෙන අංශ දෙකකි. දර්ශනය මගින් යෝජනා කෙරෙන ආකාරයට අපරාධ කෙරෙහි පටු ලෙස අවධානය යොමු කිරීමෙන් ඔබ්බට ගොස් ප්‍රජාව සම්බන්ධ ගැටළුවලට විසඳුම් සැපයීම සඳහා පොලීසිය සහ ප්‍රජාවන් එක්ව ක්‍රියා කළ යුතුය. එය සාර්ථකව භාවිතාවට යෙදූ කළ එමගින් ආරක්ෂාව වර්ධනය වීම සහ රැකවරණය වර්ධනය වීම සිදු වනු ඇත.

සාර්ථකත්වය පැන නැගෙන්නේ, හොඳින් ග්‍රහණය කර ගත් දර්ශනයක්, බුද්ධිමත්ව සැකසූ සැලස්මක් සහ එය ළඟා කර ගැනීම උදෙසා හොඳින් සංවිධානය කළ සහ කළමනාකරණය කළ ක්‍රියා දාමයන් යන අංශවල ප්‍රතිඵලයක් ලෙසිනි. ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක් සාර්ථකව භාවිතයට යොදා ගැනීමේදී තවත් නිශ්චිත සාධක ගණනාවක්ද අදාල වේ. රජය, පොලීසිය සහ සිවිල් සමාජය යන ප්‍රධාන කාරක බලවේගවල සහයෝගයද, යහපත් සන්දර්භයක්ද, එපමණටම යම් මට්ටමක විනයක්ද ඒ සඳහා අවශ්‍ය වේ. ඉටු කර ගත යුතු ඉලක්ක අන්තර් ජාතික ක්‍රියාකාරිකයන් අතර හුවමාරු කර ගැනීමේ අවබෝධයද, ඔවුන් අතර සම්බන්ධීකරණයද විශේෂයෙන්ම වැදගත් වේ.

ක්‍රියාවට නැගීමේ රාමුව අදියර හතරකින් සමන්විත ය. එනම්: පූර්ව විශ්ලේෂණය සහ තක්සේරුව, සැලසුම් කිරීම සහ සැලසුම් සැකසීම, ක්‍රියාත්මක වන ආකාරය කළමනාකරණය කිරීම, ඇගයීම සහ ප්‍රතිචාර වේ. එබඳු සංකීර්ණ කාර්යයකදී, වෙනස් වීම් ක්‍රියා දාමය කළමණාකරණය කිරීම ඉතා වැදගත් වේ. සාර්ථක ලෙස ක්‍රියාවට නැගීමට නම් ඒ තුළ පූර්ණ සහ සවිස්තරාත්මක උපායික සැලැස්මක් අන්තර්ගත විය යුතුය. සන්දර්භයට ගැලපෙන ආකාරයට සකසන ලද පැහැදිලි ඉලක්ක තිබිය යුතුය. එම ඉලක්ක සාර්ථක ආකාරයට ජය ගැනීම සඳහා ඊට මග පෙන්වන සැලස්මක් සැකසිය යුතුය. එහෙත් මේ සැලසුම් නම්‍යශීලී විය යුතු අතරම, වෙනස් වන තත්වයන්ට ගැලපෙන අන්දමට සැලසුම්ද වෙනස් විය යුතු බවට වග බලා ගැනීම, අඛණ්ඩව සිදු කෙරෙන අධීක්ෂණය සහ ඇගයීම් තුළින් සිදුවිය යුතුය. දුරිය නොහැකි තරම් ප්‍රමාණයක් ඉතා කඩිනමින් නොකිරීමට ප්‍රවේශම් විය යුතු අතර, පොලීසියේ සහ ප්‍රජාවේ සංවිධානමය හැකියාව වග බලා ගැනීම, අඛණ්ඩව සිදු කෙරෙන සහ ඇගැයීම් තුළින් සිදු විය යුතුය. දැරිය නොහැකි තරම් ප්‍රමාණයක් ඉතා කඩිනමින් නොකිරීමට ප්‍රවේශම් විය යුතු අතර, පොලීසියේ සහ ප්‍රජාවේ සංවිධානමය හැකියාව ක්‍රමානුකූලව වර්ධනය කල යුතුය.

අර්ථවත් ආකාරයට තමන්ද දායක වූ බවට පොලීසිය, රජය සහ සිවිල් සමාජය තුළ අදහසක් වර්ධනය කළ හැකි වනු පිණිස සැලසුම්කරණය සැලසුම් සැකසීම, ක්‍රියාවට නැගීම අධීක්ෂණය සහ ඇගයීම හැකිතාක් පුළුල් සහ සාකච්ඡාමය ස්වරූපයෙන් කළ යුතුය. ප්‍රගතිය මැනීමේ සම්මතයක් මෙම වැඩ සටහන තුළින් සකස් විය යුතුය. මෙතෙක් ළඟා කර ගත් ජයග්‍රහණ එමගින් පෙන්නුම් කළ හැකි බැවින්, මූල්‍ය ආධාර ලබා ගැනීමේදී එය උපකාරී වනු ඇත. එසේම අන්තර් ජාතික සහභාගිත්වය ලබා ගැනීමකින් තොරව, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් දිගටම පවත්වා ගෙන යා හැක්කේ කවර අවස්ථාවකදී ද යන්න තීරණය කිරීමේ මිම්මක් ලෙසද එය ක්‍රියා කරනු ඇත.

# 1 හැඳින්වීම

පොලිසිය යනු ආරක්ෂක අංශයේ වඩාත්ම විද්‍යාමාන ආයතනය වන හෙයින් පොලිසිය අරභයා කෙරෙන ප්‍රතිසංස්කරණ දිගුකාලීන මානව ආරක්ෂාව සඳහා වැදගත්ය. නීතිය ක්‍රියාත්මක නොවන විට සහ පොලිසිය විසින් සැපයිය හැකි සාමාන්‍ය ආරක්ෂාව, රැකවරණය සහ සාමකාමී ස්වභාවය නොමැති විට, පුළුල් දේශපාලනික, සමාජමය සහ ආර්ථික වර්ධනය බරපතල ආකාරයට පහත වැටේ. ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ අවශ්‍යතාවන්ට නවමු ආකාරයකින් ප්‍රතිචාර දක්වන වෘත්තීයමය සහ වග වීම සහිත පොලිස් සේවාවක් පිහිටුවීම, ගැටුම් කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා වැදගත් වේය යන පිළිගැනීම වර්ධනය වෙමින් තිබේ. නිල සංකේතමය ලාංජන වශයෙන් පොලිසිය එපමණටම වැදගත් වේ. සිය අතීත භාවිතාව වූ මර්ධනකාරී ස්වභාවයෙන් බිඳී වෙන් වී, පොලිසියේ ස්වරූපය වෙනස් වී, තමන් ඓතිහාසිකව ඉවත් වී ගිය ප්‍රජාව කරා ආපසු පැමිණ ඔවුන් සමග එක්ව ක්‍රියා කිරීම, ගැඹුරු සංකේතාත්මක කම්පනයක් ජනිත කර තිබේ.

ගැටුම් කළමනාකරණ මෙවලමක් වශයෙන් පොලිස් ප්‍රතිසංස්කරණවල ඇති වැදගත්කම එබඳු ප්‍රතිසංස්කරණ කිරීම සඳහා ප්‍රයත්න දරණ සංවිධාන සංඛ්‍යාව ඉහළ යාම මගින් සනාථ වේ. මුලින්ම එක්සත් ජාතීන්ගේ සාමසාධක කණ්ඩායම්ද, විවිධ අන්තර් ජාතික සංවිධාන රැසක්ද, සංවර්ධන බැංකුද, රාජ්‍ය නොවන සංවිධානද, පුද්ගලික සමාගම් ද (මෙම පුද්ගලික සමාගම් සංඛ්‍යාව වැඩි වර්ධනය වෙමින් තිබේ.) මෙයට හවුල් වී තිබේ. එසේම අනාගතයේදී ප්‍රතිසංස්කරණ සිදු කිරීමට අපේක්ෂා කරන සංඛ්‍යාවද පුළුල් වී තිබේ. මුල් යුගයේදී, ගැටුම්වලින් අනතුරුව **(post conflict)** පමණක් පොලිස් ප්‍රතිසංස්කරණ ඇති වූ නමුත්, අද වනවිට එය ගැටුම් වැළැක්වීමේ පුළුල් උපාය මාර්ගයක කොටසක් බවට පත් වෙමින් යයි.

පොලිස් ප්‍රතිසංස්කරණ සඳහා දෙනු ලබන අන්තර් ජාතික සහාය පුළුල් පරාසයක පැතිරෙයි. එය දකුණු අප්‍රිකාව, මලාවි සහ උතුරු අයර්ලන්තය බඳු දේශයන්හි ආරම්භ කළ වැඩ සටහන්වලට සහාය දැක්වීමේ සිට කොසෝවෝ සහ නැගෙනහිර ටිමෝරය බඳු පශ්චාත් ගැටුම් සන්දර්භයක් සහිත ප්‍රදේශවල වැඩි අන්තර් ජාතික දායකත්වයකින් යුතුව ඇරඹි වැඩ සටහන් දක්වා පැතිර යයි. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්වල නිරත ක්ෂෙත්‍ර කාර්ය මණ්ඩලයෙන් හතරෙන් එකකට ආසන්න පිරිසක් මේ වන විට පොලිස් ප්‍රතිසංස්කරණවලට සම්බන්ධ යම් යම් කාර්යයන්හි සහ ඉරාකය බඳු රටවල දිගු කාලීන ආරක්ෂාව සැපයීමට සම්බන්ධ උපායික කටයුතුවල නිරතව සිටිති. සුඩානය සහ ඇෆ්ගනිස්තානය තුළදී ඊට පොලීසිය වෘත්තීයමය තත්වයට පත් කිරීම සහ එකිනෙකට ප්‍රතිවිරුද්ධ ප්‍රජාවන් අතර සබඳතා දියුණු කිරීමද ඇතුළත්ය[1].

ප්‍රතිසංස්කරණය කවුරුන් විසින් ක්‍රියාවට නැගුවද, එය ගැටුම් චක්‍රයේ කවර අදියරක පැවතුනද, පොලීසියේ හෝ මහජනතාව තුළ ඒ කෙරෙහි ඇති ආකල්පවල වෙනස්කම් සිදු කිරීම දුෂ්කර කාර්යයක් බව සනාථ වී තිබේ. නිල ඇඳුම් හැඳ ගත් නිලධාරියෙකු යනු ආරක්ෂාව සහ රැකවරණය ලබා දෙන ප්‍රභවයක් වනු වෙනුවට, භීතිය උපදවන පුද්ගලයෙකු ලෙස සැලකෙන සමාජ තුළදී පොලීසියේ සුජාතභාවය ගොඩ නැගීම අරභයා පැන නැගෙන බරපතල ගැටළුවලට පොලීසිය මුහුණ දී සිටී. දිගු කලක් පුරා පැවති අවිශ්වාසය හා සැක සංකා අභිබවනය කිරීම අසීරුය; විශ්වාසයේ සහ ආත්ම විශ්වාසයේ නව සංස්කෘතියක් බිහි කිරීම දුෂ්කරය.

එපමණක් නොව පැහැදිලිව සැකසුණු උපාය මාර්ග සහ අරමුණු අඩංගු වන සංකල්පීය ආකෘතියක්ද, අන්තර් ජාතික පොලිස් ප්‍රතිසංස්කරණ කටයුතු තුළ නොමැත. මූලික සංකල්ප පිළිබඳව පැහැදිලිකමක් නොමැති විටදී, වෙනස් කිරීම් පිළිබඳව මේ වන විටත් සැකයෙන් බලන නැතහොත් සමහර විට විරුද්ධත්වය පවා පළ කරනු ලබන ඉලක්ක පොලිස් කණ්ඩායම් හමුවේ, ප්‍රතිසංස්කරණ සිදු කිරීමෙන් අත්වන වාසි ගැන ඒත්තු ගැන්වෙන අයුරින් කරුණු පැහැදිලි කිරීමේ දුෂ්කරතාවයකට අන්තර් ජාතික ක්‍රියාකාරිකයන් පත් විය හැකිය, සංකල්පීය වශයෙන් අවුල් සහගත භාවය, පැහැදිලි මෙහෙයුම් සැලැස්මක් නොමැති වීම මගින් වඩාත් තීව්‍ර වූ කළ, බොහෝ විට ඇති විය හැකි විපාකය වන්නේ වැඩ සටහන් අවුල් වී මුලින් අපේක්ෂා කළ ප්‍රතිඵල හීන වීමය.

පොලිස් ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය සංකල්පීය රාමුවක් සැපයීම සඳහා අවශ්‍ය කරුණු සාකච්ඡා කොට ලේඛනයක් සැකසීම සඳහා, ලන්ඩන් නගරය පදනම් කර ගනිමින් කටයුතු කරන ස්වාධීන සංවිධානයක් වන සේෆර්වර්ල්ඩ් ආයතනය හා අන්තර් ජාතික සාම ඇකඩමිය විසින් 2004 මාර්තු මාසයේ නිව් යෝර්ක් නගරයේදී දෙදින වැඩමුළුවක් පවත්වන ලදී. *ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක දර්ශනය සහ මූලධර්ම* යනු පොලිස් ප්‍රතිසංස්කරණවල මූලික දාර්ශනික අංග ලක්ෂණ විස්තර කිරීම සඳහා සේෆර්වර්ල්ඩ් ආයතනය විසින් ලියන ලද ලේඛනයකි.[2] මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද එය,

1 එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම් පිළිබඳ කමිටු වාර්තාව (**Brahimi report**) 2000, 181 වන ජේදය

2 සේෆර්වර්ල්ඩ් සංවිධානයට සහ සුළු අවි සහ සැහැල්ලු ආයුධ පාලනය සඳහා වන අග්නිදිග යුරෝපීය නිශ්කාෂණ මධ්‍යස්ථානය (**SEESAC**) සහ ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ දර්ශනය සහ මූලධර්ම සඳහා සහාය දක්වන ලද්දේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (**UNDP**) සහ අග්නිදිග යුරෝපීය ස්ථාවරත්ව ගිවිසුම, 2003 විසිනි, හෙස්ටා ග්‍රෝන්වෝල්ඩ්, ඩේවිඩ් හෙන්ඩ්‍රික්, ගුහැම් මතායස් සහ ගෝර්ඩන් පීක් මෙම වාර්තාවේ කතුවරු වෙති. ප්‍රකාශනය කළමනාකරණය ගැටුම් වැළැක්වීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ මණ්ඩලය/**UNDP** සහ **UNDP** ඇල්බේනියානු දේශීය කාර්යාලය විසිනි. පහත සඳහන් වෙබ් අඩවිය තුළින් මෙම වාර්තාව ලබා ගත හැකිය **http://www.saferworld.org.uk/policing/cbpbalkans.htm**

ඇල්බේනියාවේ සහ කෙන්යාවේ පොලිස් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා අත් පොතක් වශයෙන් මේ වන විටත් භාවිතා කෙරෙමින් තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය, ආධාර කණ්ඩායම් සහ ස්වාධීන විශේෂඥ ආයතන වෙතින් විශේෂඥ පරිචායකයින් **(practitioners)** රැස් කොට පවත්වන ලද මෙම වැඩ මුළුවේ අරමුණ වූවේ, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක අන්තර්ගතය කුමක්ද යන්න සහ පුළුල් ගැටුම් කළමනාකරණ උපාය මාර්ගයකට එය ගැලපෙන්නේ කෙසේද යන්න ගැනත් පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමය.

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව නම් සංකල්පය, ගැටුම් කළමනාකරණ යාන්ත්‍රණයක් ලෙසින් භාවිතා කළ හැකි ආකාරය ගැන පළමු දින සාකච්ඡාකර විමසා බලන ලද අතර, එය ක්‍රියාවට නැගීම සඳහා සැලසුම් කළ වැඩ සටහන් ප්‍රවේශයන්ද ඇගයීමට ලක් කරන ලදි. පොලිස් ප්‍රතිසංස්කරණ තුළදී ප්‍රජාව පදනම් කර ගත් ප්‍රවේශයක් කෙතරම් දුරකට, ගැටුම් කළමනාකරණ පුළුල් උපාය මාර්ග සමග අනුගත වේද, සහාය වේද යන කරුණුද සළකා බලන ලදි. පොලිස් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පිරිස්වලට ප්‍රයෝජනවත් විය හැකි මාර්ගෝපදේශ පද්ධතියක් සැකසීම දෙවැනි දිනයේ අරමුණු විය. දෙදින වැඩ මුළුවේදී සාකච්ඡා කල කරුණුවල සාරාංශයක් මෙම වාර්තාව මගින් එළි දැක්වෙන අතර, වැඩ මුළුවට සහභාගි වූ පිරිස්වල දැනුම සහ අත්දැකීම් මත පදනම්ව සැකසූ මාර්ගෝපදේශ පද්ධතියක් ලෙසින්ද එය පොලිස් ප්‍රතිසංස්කරණ සිදු කිරීමට අපේක්ෂිත පුද්ගලයන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

## 2 ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා - පොලිස් සේවා ප්‍රතිසංස්කරණ සඳහා ආකෘතියක් වශයෙන්

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව යනු, අපරාධ, කලබල සහ ආරක්ෂාව සම්බන්ධ ගැටළු විසඳීම සඳහා පොලීසිය සහ ප්‍රජාව එක්ව නව මාර්ග සෙවීමට මග පාදා දෙන දර්ශනයක් (චින්තන මාර්ගයක් ) සහ සංවිධානමය උපාය මාර්ගයක්ද (එම දර්ශනය ක්‍රියාවට නැගීමේ ආකාරයක්) වේ. එය ප්‍රධාන අංග දෙකක් මත පදනම් වේ. පොලීසියේ ක්‍රමවේදයන් සහ භාවිතාවන් වෙනස් කිරීම සහ පොලීසිය හා ප්‍රජාව අතර සම්බන්ධතාවයක් ගොඩ නැගීමට පියවර ගැනීමය.




ඡායාරූපය:- අන්තර් ජාතික සාම ඇකඩමියේ සභාපති, ඩේවිඩ් මැල්කම් මහතා සහ එක්සත් ජාතීන්ගේ කැනඩා නිත්‍ය නියෝජිත ඇලන් රොක් මහතා.

### ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ මූල ධර්ම

1 බිය ගැන්වීමෙන් නොව, එකඟත්වයෙන් පොලිස් කටයුතු කිරීම.
2 පොලීසිය ප්‍රජාවෙන් බැහැරව නොව ප්‍රජාවේම කොටසක් වශයෙන් ක්‍රියා කිරීම.
3 ප්‍රජාවේ අවශ්‍යතාවයන් කවරේද යන්න සොයා ගැනීම සඳහා පොලීසිය සහ ප්‍රජාව එක්ව ක්‍රියා කිරීම.
4 පොලීසිය, මහජනතාව සහ අනෙකුත් ආයතන හවුල්ව කටයුතු කිරීම.
5 පොලිස් කාර්යයන් ප්‍රජාවේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා ගැලපෙන ආකාරයට සැකසීම.

මෙම දර්ශනය ගොඩ නගා ඇත්තේ, පොලිස් කටයුතුවලදී තම අදහස් යෙදවුම් ලෙස ලබා දීමට අයිතියක් මහජනයා සතු වේය යන විශ්වාසය මත පදනම් වෙමිනි. එසේම ප්‍රජා ගැටළුවලට විසඳුම් සෙවීමේදී, පොලීසිය සහ මහ ජනතාව අපරාධ සහ සිදුවීම් තනිව ගැනීමෙන් ඔබ්බට ගොස් ඒ වෙනුවට ප්‍රජාවටම බලපාන වැදගත් කරුණුවලට විසඳුම් සෙවීමේ නව මාවත් ගැන සලකා බැලිය යුතුය යන දැක්ම මතද එය පදනම් වේ.

පොලිසිය යනු හුදෙක්ම අපරාධවලට එරෙහිව

සටන් වදින්නන් පමණක් නොව ඉන් ඉදිරියට ගිය බොහෝ අංශවලින් මහජන සේවකයන් වෙති යන පිළිගැනීම, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ කේන්ද්‍රගතවී තිබේ. එහි අවසාන ඉලක්කය වන්නේ මහජනයා සමග හවුල්ව ක්‍රියා කරන, වෘත්තීයමය නියෝජනයක් සහිත, ප්‍රතිචාරාත්මක සහ වගකියන ආයතනයක් නිර්මාණය කිරීමය. මෙම සාමය රකින නිලධාරීහු බල ඇණියක් වනු වෙනුවට සේවාවක් වන අතරම, අපරාධකරුවන් පමණක් (විය යුතු පරිදිම) බිය විය යුතු ආයතනයක් වේ.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා පුද්ගලික, ආයතනික සහ සමාජමය වශයෙන් මට්ටම් තුනක ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.[3] සේවා වටිනාකම් සහ ප්‍රවීණතා පුද්ගල නිලධාරී මට්ටමේදී යෙදෙන නමුත් එම වටිනාකම් සඳහා දිරි දීමට සමත් සහ තිරසාර ලෙස ඒවා පවත්වා ගෙන යාමට සමත් යෝග්‍ය කළමනාකරණ ව්‍යුහයක් නිර්මාණය කිරීම අත්‍යාවශ්‍ය වේ. කෙසේ වෙතත් පොලීසිය පමණක්ම ප්‍රතිසංස්කරණය ලක් කිරීම ප්‍රමාණවත් නැත. පොලීසියේ මූලික ඉලක්ක සපුරා ගැනීමෙහිදී ප්‍රජාවගේ සහාය සහ උපකාරයද අවශ්‍ය වේ. එ හෙයින්, සාධාරණ හේතුන් නිසාම හෝ පොලීසිය කෙරෙහි අවිශ්වාසයෙන් සහ අවඥා සහගතව පසු වූ මහජනතාවගේ අදහස් යළි සකස් **(reorient)** කිරීම ඉලක්ක කළ උපාය මාර්ගද, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක් තුළ අන්තර්ගත විය යුතුමය. පොලීසිය සහ ප්‍රජාවන් අතර සහයෝගීතාවය ගොඩනැංවීම, උද්‍යෝගීමත් ප්‍රතිසංස්කරණවාදීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළු අතරින් එකක් වේ. එහෙත් මේ දක්වාම අන්තර් ජාතික ප්‍රතිසංස්කරණ කටයුතුවලදී මෙම අභියෝගය පිළිබඳව සලකා බලා ඇත්තේ මඳ වශයෙනි. එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩල අරමුණු දැක්වෙන කිසිදු ස්ථානයක, ප්‍රාදේශික ප්‍රජාව, ප්‍රතිසංස්කරණ ප්‍රමුඛතාවක් ලෙස සැලකිය යුතු බවක් නොදැක්වේ.

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා දර්ශනය විසින් පොලිසියේ සහ මහ ජනතාවගේ විශ්වාසයද වෙනස්කම් සිදු කිරීම සඳහා කැප වීමද අපේක්ෂා කරයි. එය වනාහි විවිධ මට්ටම්වල සාමූහික ක්‍රියාකාරීත්වයක් අවශ්‍ය වන සංකීර්ණ ක්‍රියා දාමයකි. එනම්, පොලිස් දෙපාර්තමේන්තුව තුළදී සහ පොදු මහ ජනතාව අතරදී, එම දර්ශනය භාවිතාව බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය සවිස්තරාත්මක උපායික සැලසුම්කරණයක් තිබිය යුතුය. කෙසේ වෙතත් අන්තර් ජාතිකව දිරිමත්කළ පොලිස් ප්‍රතිසංස්කරණ තුළ එබඳු සවිස්තරාත්මක සැලසුමක් බොහෝ විට දක්නට නොලැබේ. පොලිස් ප්‍රතිසංස්කරණ සඳහා න්‍යායිකව කැපවීම හැරුණු කොට අපේක්ෂිත වෙනස්කම් සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ගැන ඒවා තුළ සඳහන් වන්නේ මඳ වශයෙනි.

## 3 ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව - නීතිය සහ සාමය පවත්වා ගෙන යාම පමණක් නොව.

පොලිස් කාර්යයන් හුදකලාව සිදු කරනු ලබන්නක් නොවේ. පොලිස් නිලධාරීන්ගේ අවධානය ඉල්ලා සිටිනු ලබන සුවිශේෂී පොලිස් කටයුතු - වාහන නැවත්වීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේ පටන් අපරාධ මර්ධනය දක්වා - වෙනත් ආයතන සහ ක්‍රියාදාමයන් වෙත බලපාන සහ ඒවා ඇතුළත්වන ක්‍රියා මාර්ග වේ. ආරක්ෂක, සමාජ සහ සංවර්ධන අරමුණු මෙන්ම න්‍යාය පත්‍ර දියුණු කිරීම සඳහා, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් ප්‍රතිසංස්කරණ වැඩ සටහනක් කෙසේ ගැලපේද යන්න සහ සැළකිය යුතු දායකත්වයක් ලබාගත හැක්කේ කෙසේද යන්නද වැඩ මුළුවේදී සාකච්ඡා කරන ලදි.

### ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව සහ ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය.

බාහිර කාරකයින් විසින් ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණයේදී (SSR) තමන්ගේ කොටස තෝරා ගනු ලබන්නේ සමහර විට එම අංශ එකිනෙක හා බැඳී පවතින ආකාරය ගැන හෝ ඒවායේ අන්තර් සම්බන්ධයන් ගැන හෝ පැහැදිලි දැකීමකින් තොරවය. ප්‍රතිපත්ති සම්පාදන මට්ටමේදී, පොලීසිය සැලකෙන්නේ ආරක්ෂක අංශයේම අඛණ්ඩ කොටසක් ලෙසින් වුවද, දෙකොටස අතර පවතින මෙම සාම්‍යය ක්‍රියාවට නැගෙන මට්ටමේදී දක්නට ඇත්තේ කලාතුරකිනි. බොහෝ ආධාර කණ්ඩායම් ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය දකින්නේ මූලික වශයෙන්ම මිලිටරි අවශ්‍යතාවයක් වශයෙන් වන අතර එහෙයින්ම පොලිස් සේවා ප්‍රතිසංස්කරණ සඳහා වැදගත් තැනක් ලබා නොදෙති. පොලිස් සේවාවද සමහර විට ආයතනික රාමුවකට කොටු වන අතර, එය සැබෑ සම්බන්ධීකරණයක් සඳහා ආයතනික බාධාවක් ලෙස ක්‍රියා කරයි. ආරක්ෂක අංශය වශයෙන් සැලකෙන විවිධ ආයතන ඉලක්ක කර ගත් ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන් අතර සහයෝගිතාවයක් පැවතීමද වාසිදායක වේ.

3 එල්. ලින්ඩ්හෝල්ට්, පී ද මෙස්කචිටා නෙටෝ, ඩී. ටයිටස් සහ ඊ. ඇලට්කා. සංක්‍රමණීය රටවල මානව හිමිකම් සහ පොලීසිය (ලේඩින් : බ්‍රිල් ඇකඩමික් ප්‍රකාශන, 2003) පිටුව 22

4 ආර්.මානි, පලි ගැනීමෙන් ඔබ්බට: යුද සෙවණැලි යට යුක්තිය පතා (ලන්ඩන් : පොලිටි, 2002) පිටු 56 -58



ඡායාරූපය:- ග්‍රැහැම් මතායස්, ජ්‍යෙෂ්ඨ පොලිස් කටයුතු උප-දේශක. සේෆර්වර්ල්ඩ් සංවිධානය.

## ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව, නීතියේ ආධිපත්‍යය, යහ පාලනය සහ මානව හිමිකම්.

පොලිස් ප්‍රතිසංස්කරණ සාර්ථක වීමට නම් ඒවා සෙසු අධිකරණමය ආයතන සමග බද්ධ විය යුතුය. යුක්තිය පසිඳලීමේ රටාවට එළඹීමේ ලක්ෂ්‍යය සහ මහ ජනතාව සමග ඉතාමත් සමීපව සම්බන්ධව සිටින, සාධාරණ, ප්‍රවීන, වෙනස් කොට නොසලකන සහ ගෞරවාන්විත පොලීසියක් නීතියේ ආධිපත්‍යය සුරැකීමේ අවිච්ඡින්න කොටසකි. අධිකරණ සහ නිවැරදි කිරීමේ සේවාවන් සමග එක්වූ පොලීසිය, අධිකරණ පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතන තුන අතර එක් අත්‍යවශ්‍ය කොටසකි.[4] මේ ආයතන තුනෙන් එකකට පමණක් කරනු ලබන සාධනීය බලපෑම් හා සමාන බලපෑම් ඉතිරි ආයතන දෙකටද නොයොදන්නේ නම්, එලෙස මුලින් දැක්වූ සාධනීය බලපෑම්ද නිශේධනය වන බව අත්දැකීම් පෙන්වා දෙයි.

## ප්‍රජාව පදනම් කර ගත් පොලිස් කටයුතු, සංවර්ධනය සහ දරිද්‍රතාවය අඩු කිරීම

දිළිඳුබව අඩු කිරීමේ පුළුල් උපාය මාර්ගයක් සඳහාද ප්‍රජාව පදනම් කර ගත් පොලිස් ප්‍රතිසංස්කරණ මගින් දායකත්වයක් ලබා දිය හැකිය. ආරක්ෂාව, සංවර්ධනය සහ දරිද්‍රතාවය අතර ඇති සම්බන්ධතාව ආධාර දෙන ආයතන සහ රජයයන් කිහිපයක් විසින්ම හඳුනා ගෙන තිබේ. දරුණු මට්ටමේ අපරාධ හේතුවෙන් ඕනෑම ප්‍රජාවක සංවර්ධනයට බාධා පැමිණේ. ව්‍යාපාර; අපරාධවල ගොදුරු බවට පත්ව වාණිජ කටයුතුවලට (අවිධිමත් අංශයද ඇතුළුව) බාධා පැමිණ, බාහිර ආයෝජකයන් ඉවත්ව යති.

දිළිඳු ජනයා සහ අවපීඩිත ජනයාද, අපරාධ සහ ප්‍රචණ්ඩ ක්‍රියාවල ප්‍රතිඵල වශයෙන් ඉවක් බවක් නොමැතිව පීඩා-වට පත් වෙති. දූෂිත හෝ අප්‍රාණික ආරක්ෂක ආයතන වෙතින් ඔවුන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොසැලසෙයි. දේශපාලනික සහ සමාජ ව්‍යුහයන්ගේ පාර්ශවයෙන්ද දිළිඳු ජනයා කොන් කිරීමට ලක්වන අතරම, ඔවුන්ගේ දෛනික ජීවිතවලට බලපාන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් කෙරෙහි ඔවුන් විසින් කළ හැකි බලපෑමද ඉතා අල්පය.

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව, එහි හවුල්කාරීත්ව ප්‍රවේශය තුළින් අපේක්ෂා කරනුයේ, නිශ්චිත ප්‍රජාවක ජීවත්වන සියළු කණ්ඩායම්වල ආරක්ෂක සහ රැකවරණ අවශ්‍යතා සපුරා ලීමටය. ඔවුන්ගේ සමාජ සහ ආර්ථික තත්වයන් නොසලකා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට එළඹීම සඳහා සියළු ජනයාට අවස්ථාවක් සලසා දීමට පොලීසියට හැකිවේ. අපරාධවලට එරෙහිව සාර්ථකව සටන් වදින අතරම ප්‍රාදේශික අවශ්‍යතාවලට විසඳුම් සෙවීම තුළින් ආරක්ෂාව සහ රැකවරණය වර්ධනය වන අතර, ඒ සමගම සංවර්ධන කටයුතු ඇරඹීම සඳහා අවශ්‍ය තත්වයන්ද ශක්තිමත් කරයි.

## ප්‍රජාව පදනම් කරගත් පොලිස් සේවාව සහ සුළු අවි ව්‍යාප්තියට වැට බැඳීම

සුළු අවි සහ සැහැල්ලු ආයුධ **(Small Arms and Light Weapons)** ලබා ගැනීම සහ සංසරණය පාලනය කිරීම, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ අරමුණ වන, ප්‍රජා ආරක්ෂාව සැපයීමේ කාර්යය සඳහා වැදගත් වේ. කෙසේ වෙතත් පුරවැසියන් තමන් සතු ආයුධ සිය කැමැත්තෙන්ම භාර දීමට පෙළඹෙනු ඇත්තේ, මහජන ආරක්ෂාව සහ රැකවරණය වර්ධනය වී ඇති බව ඔවුන්ට වැටහේ නම් සහ පොලීසිය සහ අනෙකුත් ආරක්ෂක ආයතන කෙරෙහි කිසියම් ආකාරයක විශ්වාසයක් ඔවුන් තුළ ඇත්නම් පමණකි. සුළු අවි සහ සැහැල්ලු ආයුධ පිළිබඳ වැඩ සටහන් ශක්තිමත් කිරීමේදී, ප්‍රජාව පදනම් කර ගත් පොලීසිය විසින් වැදගත් කාර්ය භාරයක් ඉටු කළ හැක්කේ මෙහිදීය. එසේම පොලීසිය සහ ප්‍රජාව අතර යහපත් සබඳතාවක් පවතී නම්, ආයුධ තොග පිළිබඳව හෝ අවි ජාවාරම් කිරීමේදී භාවිතා වන මාර්ග පිළිබඳව හෝ තොරතුරු ලබා ගැනීමට පොලීසියට පහසු වේ.



ඡායාරූපය :හෝර්න් සමාගමේ ඒඩ්‍රියන් හෝර්න් මහතා සියෙරා ලියොන් පිළිබඳව කථා කරමින්.

## 4 පොලිස් ප්‍රතිසංස්කරණ - දුෂ්කරතා පිළිබඳව උගත් පාඩම්

පොලිස් ප්‍රතිසංස්කරණ යනු අභියෝගාත්මක කාර්යයකි. පොලිස් ප්‍රතිසංස්කරණ වැඩ සටහන්වල සාර්ථකත්වයට සහ තිරසාර භාවයට හානිකර සහ බාධා පමුණුවන ගැටළු පිළිබඳවද, වැඩමුළුවට සහභාගි වූ පිරිස සාකච්ඡා කළෝය

### ක්‍රියාවට නගන පද්ගලයන්ගේ ප්‍රමිතියේ අස්ථාවරත්ව සහ ප්‍රමාණාත්මක භාවයේ මඳ බව

පොලීසිය ප්‍රතිසංස්කරණය කිරීමේ නිරතවන අන්තර් ජාතික නිලධාරීන් විවිධ රටවල් වෙතින් ලබා ගන්නා අය වන බැවින්, අන්තර් ජාතික වශයෙන් එකඟත්වයට පැමිණි ප්‍රවේශයන් නොමැති විට නිලධාරීහු තමන්ගේම වූ පොලිස් ආකෘතියක් ආදේශ කිරීමට පෙළඹෙති. බොහෝ අවස්ථාවලදී මෙම අන්තර් ජාතික නිලධාරීන් අතර අත්දැකීම්, කුසලතා, සහ පුහුණුව පිළිබඳ බරපතල වෙනස්කම් පවතී. ප්‍රමාණවත් තරම් පුහුණුවක් ලද නිලධාරීන් සෑහෙන සංඛ්‍යාවක් සොයා ගැනීම. බොහෝ අවස්ථාවලදී දුෂ්කර එකක් වන බැවින් ප්‍රමිති පාලනය ගැටළුවක්ව පවතී.

### දුර්වල සම්බන්ධීකරණය

පොලිස් ප්‍රතිසංස්කරණ කටයුතු ඉටු කරන විවිධ ආයතන අතර දුර්වල සම්බන්ධීකරණයක් පැවතීමද දක්නට ලැබේ. බොහෝ විට සිදු වන පරිදි, එක් සංවිධානයක වැඩ සටහන් සැකසීමේ නිරත පිරිස් වෙනත් සංවිධානවල සේවයේ යෙදී සිටින තමන්ගේම වෘත්තියේ අය කරන්නේ කුමක්දැයි නොදනිති. එකඟ වූ කාර්යය සිදු වෙමින් පවතින, පවතින පරිසරයේ දැනටමත් ඇති අනාරක්ෂිත භාවය සිය වැඩ සටහන් සහ ක්‍රම වේදයන් නිසා තව තවත් සංකීර්ණ අතට හෝ නරක අතට පෙරළීමට අවකාශ ඇති විය හැකි බැවින්, ආධාර කණ්ඩායම් ඒ පිළිබඳව ඉතා දැඩි අවධානයක් යොමු කරති. මෙසේ සම්බන්ධීකරණයකින් තොර සැලසුම්වල ප්‍රතිඵල නිසා දුර්වල ලෙස සැලසුම් කළ වැඩ සටහන්, අනෙකුත් වැඩ සටහන් සමග නොගැලපෙන වැඩ සටහන් හෝ මෙයට පෙර අවස්ථාවලදීද අත්හදා බලන ලද දේවල්ම යළි යළි සිදු කිරීමේ අවදානම ආදිය බිහි විය හැකිය.

### උපායික සැලසුම් ප්‍රමාණවත් නොවීම

අරමුණු සහ එම අරමුණු සපුරා ගැනිමට අවශ්‍ය පියවර පැහැදිලිව දක්වන කාල ක්‍රමානුකූල ප්‍රවේශයක්ද බොහෝ පොලිස් ප්‍රතිසංස්කරණ වැඩ සටහන් තුළ නොමැත. නිදසුනක් වශයෙන් කොසෝවෝ ගතහොත්. අන්තර් ජාතික සිවිල් පොලීසිය එහි පැමිණ වසර පහකට පසුවත්. දේශීය පොලීසිය වෙතට වගකීම් පවරා දීමට අවුරුද්දක් පමණක් තිබියදීත්, එම බල හුවමාරුව කළ යුත්තේ කෙසේද යන්න දැක්වෙන උපායික සැලැස්මක් සකසා නොතිබුනි. පොලිස් ප්‍රතිසංස්කරණ යනු බහු - පාර්ශවික සහ බහු විධ ක්‍රියාදාමයක් වන - හෙයින් සමහරුන්ගේ තක්සේරු කිරීම්වලට අනුව එය ජීවිත කාලයක් පුරාම පැවතිය හැකිය. - වෙනස් වීම් ක්‍රියාදාමයට නිසි අනු පිළිවෙලක් තිබිය යුතුය. වැදගත් අවස්ථා පැහැදිලිව සටහන් කිරීම තුළින් පොලීසිය සහ ප්‍රජාවන් යන දෙපාර්ශවයටම ප්‍රගතිය දැක ගත හැකි මාර්ගයක් පෑදේ. හඳුනාගත හැකි ආකාරයේ වෙනසකම් ආධාර කණ්ඩායම්වල සහාය දිගටම ලබාගැනීම තහවුරු කර ගැනීමෙහි ලා වැදගත්වේ. ආධාර කණ්ඩායම්වල කෙටි කාලීනව අරමුදල් ප්‍රදානය කිරීමේ චක්‍ර ඉහතින් දැක්වූ ආකාරයේ දිගු කාලීන ක්‍රියාදාමයක් සඳහා නොගැලපේ.

### දැනුම ගබඩා කිරීමේ දුර්වලතා සහ සීමිත පාඩම් ඉගෙනීම

සීමිත පිරිස් බලයක් සහිත වීම සහ සති කිහිපයකට පමණක් සීමා වූ සේවා ගිවිසුම් සහිත උපදේශකවරුන්ගේ

සේවාව මත රඳා පැවතීමට සිදුවීමද නිසා ප්‍රතිසංස්කරණ කටයුතු ව්‍යුහ ගත කර ඇති ආකාරය අනුව ගවේෂණය කිරීමට හෝ ඉගෙනීමට දිරිදෙන ස්වභාවයක් ඇති නොවේ. විවිධ ක්‍රියාකාරිකයන් (ආයතන සහ පුද්ගලයන්) ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක් ක්‍රියාත්මක කිරීමේදී ලද අත්දැකීම් සහ එම අත්දැකීම් අනුසාරයෙන් උගත් පාඩම් ගැන ප්‍රමාණවත් තරම් තොරතුරු ප්‍රසිද්ධියට පත් කර නැතः එසේත් නැතහොත් එබඳු තොරතුරු කරා කඩිනමින් ප්‍රවේශ විය නොහැකිය.

## ඇගයීම ප්‍රමාණවත් නොවීම

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව තුළදී සාර්ථක කුමක්ද, අසාර්ථක කුමක්ද යන්න ගැන ඇත්තේ සීමිත දැනුමකි. එහෙයින් ඇගයීම, වැඩ සටහන් සැලසුම් කිරීමේ දී ප්‍රමාණවත් තරමේ ප්‍රමුඛතාවක් සහිතව අන්තර්ගත කිරීම මෙතෙක් සිදු වී නැති අතරම ඇගයීම හා බැඳුණු නිශ්චිත අභියෝගද ඇත. නිදසුනක් වශයෙන් ප්‍රගතිය මැනීම සඳහා යොදා ගත හැකි වඩාත්ම යෝග්‍ය සහ යථාර්ථවාදී කඩ ඉම් සහ දර්ශක තෝරා ගැනීම දැක්විය හැකිය. මෙයට අතිරේකව සහෝදර සංවිධාන විසින් නිශේධාත්මක ප්‍රතිඵල කෙසේ ග්‍රහණය කර ගනු ඇත්ද යන්න ගැන ඇති සංවේදී භාවය නිසා - අන්තර් ජාතික සහ අදාල රටේ ක්‍රියාකාරිකයින් යන දෙකොටසටම අගනා අධ්‍යයන අවස්ථාවක් විය හැකි - සවිස්තරාත්මක ඇගයීම් සඳහා අවකාශ ලබා දීමට අන්තර්ජාතික සංවිධාන පසුබට වන බවක්ද දක්නට ලැබේ. ආයතනික කීර්ති නාමය රැක ගැනීමට දක්වන මෙම අභිලාශය හේතුවෙන් අන්තර් ජාතික ක්‍රියාකාරීන්ටත් දේශීය ක්‍රියාකාරීන්ටත් යන දෙකොටසටම ප්‍රයෝජනවත් ඉගෙනීමේ අවස්ථා ගිලිහී යා හැකිය.



ඡායාරූපයः- කිරාන් බේඩි, සිවිල් පොලිස් උපදේශිකා, එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුව.

## අරමුදල් ප්‍රමාණවත් නොවීම

ප්‍රතිසංස්කරණ සිදු කරන පුද්ගලයන් විසින් ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරන අරමුණු සහ වටිනාකම්, හා එකී වෙනස්කම් කිරීම සඳහා සපයනු ලබන අරමුදල් මට්ටම් අතර ගැඹුරු අසම්බන්ධයක් පවතී. පොලිස් ප්‍රතිසංස්කරණ ලාභයට සහ පහසුවට කළ නොහැකි නමුත් ඒ සඳහා ලැබෙන අරමුදල් බොහෝ විට, එමගින් අපේක්ෂා කරන අරමුණු සාක්ෂාත් කර ගැනීමට ප්‍රමාණවත් නැත. මිනිය හැකි ආකාරයේ ප්‍රතිඵල නිෂ්පාදනය වීමට අවශ්‍ය කාලය ගත වීමට පෙරම බොහෝ විට ආධාර කණ්ඩායම්වල උනන්දුව හීන වී යන බව දක්නට ලැබේ. දිගු කාලීනව කෙරෙන කැපවීමකින් තොරව, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා ප්‍රවේශයක් මත පදනම් වූ පොලිස් ප්‍රතිසංස්කරණ අරමුණු ජය ගත නොහැකිය. එබැවින් අස්ථාවර ප්‍රදේශ සඳහා ලැබෙන අන්තර් ජාතික සහයෝගය කෙටි කාලීන වශයෙන් "ගිනි නිවීමට" හැර ඉන් ඔබ්බට යොදා ගත නොහැකි වන ලෙසින් රැඳී පවතිනු ඇත.

## ආයතනික විරෝධය

පොලිස් බලකාය තුළ පවතින මෙහෙයුම් සංස්කෘතිය


ඡායාරූපයः- සියෙරා ලියොන් හි මානව හිමිකම් පුහුණුව.

අරහයා ක්‍රියා කළ යුතුමය. බොහෝ විට පොලීසිය ගැන හඳුන්වන්නේ එය වෙනස්කම්වලට විරෝධය දක්වන සහ ඉන් පරිබාහිර පුද්ගලයන් කෙරෙහි අවිශ්වාසයෙන් පෙලෙන ආයතනයක් වශයෙනි. පොලිස් ප්‍රතිසංස්කරණ

හේතුවෙන් පොලිස් නිලධාරීන්ට වැඩි වැඩ කටයුතු ප්‍රමාණයක් කිරීමට සිදුවීම හෝ ඔවුන්ගේ සුවපහසු රාජකාරි භාවිතාවන්ට බාධා වීම නිසා, වෙනස්කම්වලට එරෙහි වීමේ අවශ්‍යතාවයක් නිලධාරීන් වෙත තිබිය හැකිය. පුද්ගල මට්ටමේදී පසුබෑමක් පවතින සංවිධානයක් තුළට දර්ශනයේ සහ ප්‍රවේශයේ වෙනස්කම් කා වැද්දීම අසීරු විය හැකිය. තමන් දන්නා දෙයින් ඉවත්ව නව ආකල්ප වැළඳ ගැනීම දක්වා පොලීසිය යළි හැඩ ගැස්වීම වෙනම ම අරගලයක් විය හැකිය. සමහර කොටස් වෙනස්කම් සඳහා එකඟ විය හැකි නමුත් තවත් සමහරු එසේ නොවිය හැකිය. අන්තර් ජාතික ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරිකයන් මෙම විරෝධතාවයට මුහුණ දීමට තැත් කළ ආකාරය විවේචනයට භාජනය විය. නිදසුනක් ලෙස, පොලිස් ප්‍රතිසංස්කරණ පිළිබඳ වාර්තා බොහෝ විට ලියා ඇත්තේ, රාජකාරියේ නියුක්ත සාමාන්‍ය පොලිස් භටයන්ට කියවා අවබෝධ කර ගත නොහැකි ශෛලියකිනි.

## 5 ක්ෂෙත්‍රයේ අත්දැකීම් : ප්‍රජාව පදනම් කර ගත් පොලිස් කටයුතු භාවිතාවට නැගීම

පොලිස් ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රජාව පදනම් කර ගන්නා, සමස්තය ආවරණය වන ප්‍රවේශයක් යොදා ගන්නා ආකාරයද, එක් එක් ව්‍යාපෘතියේ ඇති එකිනෙකට වෙනස් වේගය, පරිමාව, සහ ප්‍රතිඵල පිළිබඳවද උදාහරණ වශයෙන් සියෙරා ලියොන් සර්බියාව සහ උතුරු අයර්ලන්තය තුළ සිදුවූ කටයුතු දැක්විය හැකිය. නිශ්චිත නිගමනයකට එළඹීමට තවමත් කල් වැඩි වුවද, කටයුතු සාර්ථක වීම කෙරෙහි අඩුවෙන්ම අපේක්ෂා තැබූ සියෙරා ලියොන්හිදී උපරිම සාර්ථකත්වයක් ලැබෙමින් පවතින බවක් පෙනී යයි.

### සියෙරා ලියොන්

1990 දශකයේ අවසානය ආසන්න වන විට පොලිස් ප්‍රතිසංස්කරණ සඳහා කිසිදු යහපත් වාතාවරණයක් සියරා ලියොන්හි නොවූ බවක් පෙනී ගියේය.[5] වසර හයක් ඉක්ම යාමෙන් පසුව ස්වාධීන අධ්‍යයනයන් වාර්තා කරන ආකාරයට, පොලීසියේ හැසිරීම, ප්‍රමිතීන් සහ වග වීම වර්ධනය වීමද ඇතුළුව විවිධ අංශවල සැලකිය යුතු ප්‍රගතියක් පොලීසිය තුළ සිදුවී ඇත. දේශපාලන මැදිහත්වීම් පාලනයකට නතු කිරීම, අවසාන ඉලක්කයක් තිබීම, සහ සපුරා ගත යුතු උපායික සැලැස්මක් නිර්මාණය කොට ඊට අනුගත වීම යන කරුණු, මෙතෙක් ලැබූ සාර්ථකත්වය සඳහා ආධාරක වූ තීරණාත්මක සාධක ලෙස ඉදිරිපත් කරන ලදී. ප්‍රතිසංස්කරණ කටයුතු මෙහෙයවීම සඳහා පැමිණි බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩල කණ්ඩායම දුටුවේ පොලීසිය ඉතා පහත් මට්ටමක පවතින බවත්, ඔවුන් හමුවේ ඇති අභියෝග ජය ගැනීම සඳහා ඔවුන් කිසිසේත්ම සමත් නොවන බවත්ය. රටේ බොහෝ ප්‍රදේශවල පොලිස් කටයුතු කිසිවක් සිදු නොවීය.රටේ වෙනත් බොහෝ රාජ්‍ය ආයතන මෙන්ම සියෙරා ලියොන් පොලිසියද (SLP) පහසුවෙන් ප්‍රතිසංස්කරණය කළ නොහැකි ආකාරයට දිරාපත්ව තිබුණි. එකකට පසුව එකක් බැගින් බලයට පත් ආණ්ඩු විසින් මෙම පොලිස් සේවාව හිස් ආයතනයක් බවට පත් කරන ලදුව, බොහෝ පොලිස් ගොඩනැගිලි විනාශයට පත්ව තිබුණි. ඉතාම මූලික උපකරණ, එනම් පෑන් සහ පැන්සල් වැනි දෑ පවා නිලධාරීන්ට ලබාදී නොතිබුණි. බොහෝ දෙනෙකුට අවුරුදු ගණනාවකින් කිසිදු පුහුණුවක් ලබාදී නොතිබූ අතර ඔවුහු තම වෘත්තියේ මූලික කරුණු ගැන පවා අවබෝධයකින් තොර වූහ. එපමණක් නොව සියෙරා ලියොන් පොලීසිය රාජ්‍ය මර්දනයේ අවියක් ලෙසින් දිගු කලක සිට භාවිතා වීම සහ එහි ආයතනගතව තිබූ දූෂණය නිසා ඒ කෙරෙහි වූ මහජන විශ්වාසය බිඳ වැටී තිබුණි.

මෙම බිඳී ගිය විශ්වාසය පිළිසකර කිරීම, ප්‍රතිසංස්කරණ කටයුතුවල නිරතවූ අයගේ ප්‍රාථමික අරමුණ විය. ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම තුළ ප්‍රජාව කර ගත් මූලධර්ම කෙරෙහි දැඩි අවධානයක් යොමු කර තිබූ අතර පුද්ගල, ආයතනික සහ සමාජමය තලවල වෙනස්කම් සිදුකිරීමේ අනුපිළිවෙලක් ගැනද දැඩි අවධානයක් යොදන ලදී.

පුද්ගල මට්ටමේදී, විපතට පත් වූවන්ට සහාය දීම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ අපරාධ වැලැක්වීමද ඇතුළුව "ප්‍රාදේශික අවශ්‍යතා" පිළිබඳව නිලධාරීන්ගේ ප්‍රවීනත්වය වර්ධනය කිරීමට අරමුණු කළ පුහුණුවක් පොලිස් නිලධාරීන්ට ලබා දෙන ලදි. අළුතෙන් සේවයට බඳවා ගත් නිලධාරීන්ට පමණක් නොව තම කුශලතා අකර්මන්‍ය භාවයට පත්ව සිටින හෝ කිසිදාකවත් පුහුණුවකට සහභාගි නොවූ, දැනට සේවයේ නිරත පොලිස් නිලධාරීන්ටද එම පුහුණුව ලබා දීමට ඉලක්ක කරන ලදි.

"ප්‍රජාව පදනම් කර ගත්" දර්ශනයක් ඇතුළත් කර ගත හැකි වනු පිණිස පොලිස් සංවිධානය බරපතල ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදි. අපැහැදිලි සහ අවුල් සහගත කළමනාකරණ ව්‍යුහයන් වඩාත් පාරදෘෂ්‍ය ඒවා බවට පත් කරන ලදි. පොලිස් සේවාව තුළ උසස්වීම් සහ නව

[5] මෙම කොටස උපුටා ගත්තේ ඒඩ්‍රියන් හෝර්න් මහතා විසින් වැඩ මුළුව සඳහා සැකසූ වාර්තාවකිනි.

බඳවා ගැනිම් සඳහා "මිත්‍ර සංග්‍රහය" වෙනුවට කුසලතා මත පදනම් වූ සම්මත පටිපාටියක් යොදා ගන්නා ලදි. දූෂණයට වැට බැඳීමේ අරමුණින් යුතුව නව මාදිලියක මූල්‍ය කළමනාකරණ රටාවක් හඳුන්වා දෙන ලදී. මහජනයාගේ පැමිණිලි ලබා ගැනීම සඳහා සැකසූ නව ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් වශයෙන් නිලධාරීන්ගේ වග වීමද වර්ධනය කරන ලදි.

දිගු කලක සිට පොලීසිය වෙතින් වියෝවී සිටි ප්‍රජාව කරා යලි සමීපවීම සඳහා පොලීසිය දැනුවත් සහ ප්‍රබල උත්සාහයක් දරණ ලදි. මහජනයාගේ අයිතීන්, පොලීසියේ කාර්යභාරය, ප්‍රජා ආරක්ෂාව සහ රැකවරණය සඳහා සහාය දීම් වස් පොලීසිය විසින් යොදා ගත හැකි ක්‍රමවේද ගැන දැනුවත් භාවය ඉහළ නැංවීම සමග එම ක්‍රියාදාමය ආරම්භ විය. විශේෂයෙන් අවදානමට ලක්වූ පිරිස් සහ කාන්තාවන් සහ ළමුන් වැනි සිවිල් යුද සමයේදී අසාධාරණ ලෙස බලවත් පීඩාවට පාත්‍ර වූ කොටස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදි.

මහජන දායකත්වය ලබා ගැනීම සඳහා පිහිටවූ ආයතන අතර, පොලිස් සේවාවක් ගැන හඬක් මතු කළ, අපරාධ වැළැක්වීමේදී කාර්ය භාරයක් ඉටු කළ, සහ පොලීසියේ කටයුතු නිරීක්ෂණයට ලක් කිරීමේ මාර්ගයක්වූ සිවිල් සමාජ මණ්ඩලයක්ද විය.

වෙනස්කම්වලට එරෙහි ආයතනගත විරෝධය මැඩ ලීමෙහිදී ජාතික මට්ටමේ දේශපාලන අධිෂ්ඨානය තීරණාත්මක විය. කෙතරම් හොඳින් මූල්‍ය ප්‍රතිපාදන ලැබී තිබුණද, ඒවා නොමැති වූ කළ අන්තර් ජාතික මැදිහත්වීම් කඩිනමින් වියැකී යනු ඇත. ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ පැවත්ම රජයේ අඛණ්ඩ සහයෝගය මත රඳා පවතී.

## සර්බියාව

සර්බියාවේ පොලිස් කටයුතුවලට නව, සමස්තය ආවරණය වන, ප්‍රජාව පදනම් ප්‍රවේශයක් ඇතුළත් කිරීමේ ක්‍රියාදාමය අභියෝග ගණනාවකට මුහුණ දුන්නේය. ආයතනික මට්ටමේ ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ අවශ්‍යතාවයද ඒ අතර වූ වැදගත් එකකි.[6] 2004 දී පැවති සර්බියානු පොලීසිය, මිලොසෙවික් පරිපාලනය යටතේ දේශපාලන මෙවලමක් වශයෙන් යෙදවූ පොලීසියට වඩා අතිශයින්ම වෙනස් වූ නමුදු නූතන, නියෝජනය සහිත සහ ප්‍රජාතන්ත්‍රවාදී පොලිස් සෙවාවක් සඳහා අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය විසින් සකසන ලද අරමුණු සපුරා ගැනීම සඳහා ඔවුන් තව දුරටත් උත්සුක විය යුතුය. "යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාව පිළිබඳ සංවිධානයේ" (OSCE) සහාය ලබාගෙන සැකසූ විශේෂඥ පුහුණු වැඩ සටහන් තුළින්, පුද්ගල ශක්‍යතා සහ පුද්ගල ඍජු භාවය දියුණු කිරීම පිණිස වැදගත් වෙනස්කම් සිදු කරන ලදි. කෙසේ වෙතත්, (සියෙරා ලියොන්හි දී සිදු වූ පරිද්දෙන්) ආයතනික ශක්‍යතාව ගොඩ නැගීම සඳහාද ඉහත කරුණ හා සම්බන්ධ ඉලක්කයක් නොවූයෙන්, නිලධාරීන්ගේ පුද්ගලික හැකියාවන් වර්ධනය කිරීමේදී දැක්වූ අපේක්ෂිත බලපෑමේ ප්‍රගතිය සීමා විය. ප්‍රමාණවත් කළමනාකරණයක් සහ ආයතනික ව්‍යුහයක් නොමැති වීම හෝ එබඳු වෙනස්කම් සඳහා සහාය දක්වනු වස් ගොඩ නැගූ නීතිමය/පටිපාටිමය රටාවක් නොමැති වීම (උපායික කළමනාකරණය, සම්පත් කළමනාකරණය, සහ මෙහෙයුම් ක්‍රියාදාමය වැනි ක්ෂේත්‍රවල) ඊට හේතු විය. එහි ප්‍රතිඵලය වූයේ, සමස්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සමග සම්බන්ධ නිලධාරීන් සහ නව තාක්ෂණික ක්‍රම හැදෑරූ එහෙත් ඒවා භාවිතාවට යොදා ගත නොහැකි වූ නිලධාරීන් දුර්මුඛ වීමය.

පොලිස් සේවාවේ නියෝජිත ස්වභාවය සහ ප්‍රජාව කේන්ද්‍ර කර ගැනීම වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගනිමින් කාන්තා පොලිස් නිලධාරීන් වැඩි ප්‍රමාණයක් යොදා ගැනීම සහ දකුණු සර්බියාව තුළ බහු වාර්ගික පොලිස් සේවයක් ඇති කිරීම අංශයෙන් ගෙවී ගිය වසරවලදී ප්‍රගතියක් අත් කර ගෙන තිබේ. ප්‍රජා - පොලිස් විශේෂිත නියමු ව්‍යාපෘති හඳුන්වා දීම සමග එක්වූ නූතන පොලිස් පුහුණු පාඨමාලාවන්. සර්බියානු ජනතාවගේ විශ්වාසය යළි දිනා ගැනීම සඳහා සාධනීය ආකාරයේ දායකත්වයක් දක්වා තිබේ.

එහෙත්, සර්බියානු පොලිස් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඉදිරියේ බරපතල අභියෝග ගණනාවක් පවතී. පොලීසිය වගකීමෙන් යුතුව ක්‍රියා කරන බවට තහවුරු විය හැකි වර්ධිත ව්‍යුහයක් නොමැති වීම, සැබෑ පාරදෘෂ්‍ය පොලිස් සේවාවක් ඇති කිරීමෙහි ලා බාධකයක්ව තිබේ. ඒ අතර ප්‍රමාණවත් මූල්‍ය කළමනාකරණයකින් තොරව වේගයෙන් වැඩෙන පරිපාලනය නිසා සම්පත් ඵලදායක ආකාරයට යොදා ගැනීමට බාධා පැමිණෙමින් තිබේ. පොලිස් සේවාව දක්ෂතා පූර්ණ පුද්ගලයින් සඳහා ගැලපෙන වෘත්තියක්ය යන විශ්වාසය, යල් පිනූ කළමනාකරණ පටිපාටි සහ පාරදෘෂ්‍ය භාවෙයන් තොර උසස්වීම් ක්‍රමය හේතුවෙන් දුබලවී යන

6 වැඩ මුළුව සඳහා ආචාර්ය මාර්ක් ඩොව්න්ස් විසින් සැකසූ සාමය ආරක්ෂා කිරීමේ සිට බහු වාර්ගිකත්වයක් තුළ ස්ථාවර පොලිස් ප්‍රතිසංස්කරණ තහවුරු කිරීම, පශ්චාත් ගැටුම් සහ සංක්‍රමණීය පරිසරය : සර්බියාවේ අත්දැකීම්

අතරම, අතිශයින්ම මධ්‍යගත කළමනාකරණ ව්‍යුහයක් ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව බිම් මට්ටමේදී ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණෙයි. දේශපාලනික සහ මෙහෙයුම් අංශ අතර පැහැදිලි බෙදීමක් නොමැති වීම. වෙනත් පාර්ශව විසින් පොලීසිය මෙහෙයවෙනු ලැබීමට මග පාදයි. ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා තවත් ව්‍යවස්ථාමය සහ විධි විධානමය වෙනස්කම් සිදු කිරීම අවශ්‍යය. ව්‍යවස්ථාමය වෙනස්කම් මේ දක්වා ඉලක්ක කර තිබුණේ, සමස්ත ක්‍රමයේම පුළුල් සංශෝධනයන් කරනු වෙනුවට, යල් පැන ගිය රටාවක් මත පදනම් වූ ව්‍යවස්ථාමය රාමුව යලි ප්‍රතිසංස්කරණය කිරීමටය.

අන්තර් ජාතික ප්‍රජාවටද වැදගත් වැඩ කොටසක් ඉටු කිරීමට තිබේ. ආධාර සම්බන්ධීකරණය සහ නිසි පරිදි ස්ථානගත කිරීම වඩාත් හොඳින් කළ හැකිය; කළ යුතුය. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අන්තර් ජාතික ප්‍රජාව විසින් සාධනීය බලපෑමක් කිරීමට නම්, ආධාර උපයෝගි කර ගැනීම - පොදු අරමුණක් සඳහා




ඡායාරූපය:- කෙන්යාවේ පොලිස් ප්‍රජා කටයුතු

## සේෆර්වර්ල්ඩ් සහ කෙන්යාවේ ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව

කෙන්යානු රජය, සේෆර්වර්ල්ඩ් සංවිධානය සහ ආරක්ෂක පර්යේෂණ හා තොරතුරු මධ්‍යස්ථානයද පීස්නෙට් සංවිධානයද, ඇතුළු ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන සමග එක්ව, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා ප්‍රතිසංස්කරණ පිළිබඳව උන්නතිකාමී වැඩ සටහනක් දියත් කලේය.

පොලීසියටත්, ප්‍රාදේශිය ප්‍රජාවන්ටත් පොදු මග පෙන්වීමක් ලබා දෙන, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා ජාතික ප්‍රතිපත්තියක් එම වැඩ සටහන විසින් නිර්මාණය කරමින් තිබේ. තමන්ගේ කාර්ය භාරය පැහැදිලි කර දීමටත් වර්ධිත සේවා සැපයීම ඔවුන්ගේ කටයුතුවල ප්‍රමුඛස්ථානයේ තැබීමත් අරමුණු කර ගනිමින්, කෙන්යාවේ පොලිස් සේවාවන් දෙක වන කෙන්යා පොලීසිය හා පරිපාලන පොලීසිය සඳහා උපායික සැලසුම් දෙකක් සැකසීම මගින් මෙම කාර්යය සම්පූර්ණ විය. එසේම, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් නවකයන් සහ ප්‍රජා නායකයන් පුහුණු කිරීමේදී භාවිතා කරන ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව පිළිබඳ නව පුහුණු විෂය මාලාවක්ද සකසා ඇත. මෙය ප්‍රතිසංස්කරණ වැඩ සටහන ගැන දැනුවත් භාවය වර්ධනය කිරීමට සහ පොලිසිය සමග එක්ව කටයුතු කරනු වස් මහජනතාව දිරි ගැන්වීමට සකසන ලද මාධ්‍ය ප්‍රචාරක කටයුතු සහ මහජන අධ්‍යාපනය සමග බැඳී පවතී.

රජය, නාගරික සහ ග්‍රාමීය ස්ථාන දෙකක, තෝරා ගත් නියමු ව්‍යාපෘති දෙකක් වශයෙන් ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා කටයුතු ක්‍රියාවට නගා තිබේ. අපරාධ වැලක්වීමේද විපතට පත් අයට සහය වීමේද ඒකාබද්ධ උපාය මාර්ග සකසනු වස්, පොලිස් නිලධාරීන් සහ ප්‍රජා නායකයන් එකට එකතු කරමින්, ප්‍රජා පොලිස් සේවා මණ්ඩප ස්ථාපිත කර අවසන්ය. වැඩසටහන ඇරඹුණු පසුව එම ප්‍රදේශවල අපරාධ සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ වැටී ඇති බව පොලීසිය වාර්තා කළ අතර, මෙම ප්‍රවේශය රට පුරාම පතුරවා ලීම සඳහා රජය දැන් උනන්දුවෙන් යුතුව ක්‍රියා කරමින් සිටී.

ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය හමුවේ තවත් විශාල අභියෝග පවතින නමුත්, මෙම දිරි ගන්වන සුළු වර්ධනයන් මගින් ප්‍රගතිය සඳහා යහපත් අඩිතාලමක් සැපයේ. එහිදී උගත් පාඩම් ගණනාවක් වේ. 1). ප්‍රතිසංස්කරණ සාර්ථක වීමට නම් රජයට අයිති සැලකිය යුතු කොටසක් තිබීම සහ රජයේ සහයෝගය ලැබීම අවශ්‍ය ය. ප්‍රතිසංස්කරණ සඳහා කැප වූ නව රජයක ආගමනය සහ අවශ්‍ය දේශපාලන අනුග්‍රහය ලබා දීම හා අධීක්ෂණය සඳහා රජයේ ඉහල පුද්ගලයන්ගෙන් සමන්විතව පිහිට වූ ඉහළ මණ්ඩලය හේතුවෙන් මෙම ප්‍රගතිය සඳහා සුදුසු පරිසරය උදා විය. 2). විවිධ වෙනත් වැඩ සටහන් (පුහුණුව සහ ප්‍රතිපත්ති සම්පාදනය) පෙරට ගෙන යා හැකි පුළුල් වැඩ සටහනක් ඒ සමගම සැකසීමද පැහැදිලි වාසියකි. 3). ක්‍රියාවට නැංවීම සඳහා අනුග්‍රහය දැක්වීම පිණිස අදාළ රටේ රජයද, අන්තර් ජාතික හා දේශීය සිවිල් සංවිධානද අතර සහයෝගීතාවයක් ගොඩ නැගීම තීරණාත්මක වැදගත්කමක් උසුලයි.

යම් පමණකට පරමාධිපත්‍යය කැප කිරීමටද සමහර විට ආධාර කණ්ඩායම්වලට සිදු විය හැකිය. ඒ පිළිබඳව එකඟත්වයට එළඹි ක්‍රමයක් තිබිය යුතුය.

## උතුරු අයර්ලන්තය

පොලීසිය කෙරෙහි ඇති මහජන ආකල්ප යළි වෙනස් කිරීමේ දුෂ්කරතාවය සහ ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා දර්ශනය විසින් අපේක්ෂා කරන මට්ටමට සහ සැලසුම්කරුවන්ගේ අභිරුචියේ මට්ටමට මහජනයා දායක කර ගැනීමේ දුෂ්කරතාවය උතුරු අයර්ලන්ත උදාහරණය මගින් හොඳින් විද්‍යමාන වේ.

*රෝයල් උල්ස්ටර් කන්ස්ටබියුලරි* ප්‍රතිසංස්කරණයට ලක් කිරීම, පළාත සඳහා 1998 එළඹි *මහ සිකුරාදා ගිවිසුමේ* එක් ප්‍රධාන අංගයකි. ගිවිසුම යටතේ ස්ථාපිත කරනු ලබන විශේෂඥ මණ්ඩලයක නිර්දේශ අනුව යමින්, එම පොලිස් සේවය වඩාත් මධ්‍යස්ථ උතුරු අයර්ලන්ත පොලිස් සේවාව බවට මාරු වීමට නියමිත විය. එසේම පොලීසියේ නිලයන් තුළ කතෝලික හා ප්‍රොතෙස්තන්ත යන ප්‍රජාවන් දෙකෙහිම එක සමාන නියෝජනයක් සහිත වීමට ඉලක්ක කරන ලදි. නව පොලිස් සේවාව අප්‍රේල් මාසයේ ඇරඹිණි.

අධීක්ෂණ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ විශාල පරිමාණයෙන් ප්‍රජා දායකත්වයක් පැවතෙනු ඇතැයි අපේක්ෂා කෙරිණි. මෙය වනාහි ඓතිහාසික වශයෙන් ඌණ නියෝජනයක් සහිතව සිටි කතෝලික පක්ෂවල එක් ප්‍රධාන ඉල්ලීමකි. නව මණ්ඩලය ඉදි කෙරිණි. තේරී පත්වූ දේශපාලකයින් සහ ස්වාධීන පුද්ගලයින්ගෙන් යුත් ප්‍රාදේශීය මණ්ඩලයක් වන උතුරු අයර්ලන්ත පොලිස් සේවා මණ්ඩලය සතුව ඉමහත් අධීක්ෂණ බලතල තිබේ. පහළ මට්ටම්වලදී, දේශපාලකයින් සහ සිවිල් සමාජ නියෝජිතයන්ගෙන් සමන්විත දිස්ත්‍රික් පොලිස් සේවා හවුල් (DPP) සඳහා ප්‍රාදේශීය අධීක්ෂණ බලතල ඇති අතර ප්‍රාදේශීය පොලිස් ප්‍රමුඛතා කවරේදැයි නිගමනය කිරීමේදී විශාල කාර්ය භාරයක් ඉටු කරයි.

සියළු ආයතන ස්ථානගතව පැවතියද, ඒවා තවමත් තමන්ගෙන් අපේක්ෂිත මෙහෙවර ඉටු කර නැත. දේශපාලන අනුග්‍රහය ඔවුන් වෙතට නොලැබීම මෙයට බලපාන එක් හේතුවකි. පොලිස් සේවාව තවමත් ගැඹුරු බෙදීම් සහිත ගැටළුවක්ව පවතින අතරම, පරම්පරා ගණනාවක් තුළ වැඩී වර්ධනය වූ ආකල්ප බිඳ වැටෙන්නේ ඉතා මන්දගාමී අන්දමිනි. කතෝලිකයන්ගේ සහාය ලබා ගැනීම දුෂ්කර බව සනාථ වී තිබේ; එම ප්‍රජාව වෙතින් පොලිස් සේවාවට එක්වන සංඛ්‍යාව පහළ මට්ටමක පවතී. පළාතේ විශාලතම කතෝලික පක්ෂය සහ විශාලත්වයෙන් දෙවැනි දේශපාලන පක්ෂයද වන *සින් ෆෙන් සංවිධානය* පොලිස් ප්‍රතිසංස්කරණ අවශ්‍ය තරම් දුරට ගොස් නැති බව සිතමින්, එම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට තවමත් සහාය දීමට එකඟ වී නොමැති අතර කිසිදු වග වීමකට හෝ අධීක්ෂණ මණ්ඩලයක් සඳහා සහභාගී වීම ප්‍රතික්ෂේප කරයි. මෙහි තේරුම නම්, ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීම අරභයා පැන නගින දෛනික විවාද තුළදී එම සංවිධානයේ හඬ නොනැගෙන බවයි. වැඩ කටයුතු සඳහා හවුල් වීමද පුද්ගලිකව අනතුරුදායක කරුණක් වී තිබේ. (DPP) සාමාජිකයන් මේ ආකාරයේ ශාරීරික ප්‍රහාරයන්ට සහ බිය ගැන්වීම්වලට ලක්ව තිබේ. කිසිදු ආකාරයක මහජන උනන්දුවක් නොමැති වීමද තවත් ගැටළුවකි. ප්‍රජාව පදනම් කර ගත් ප්‍රවේශයක මූලික මූලධර්මයක් වන්නේ මහජන සහභාගිත්වය සහ මහජන අවධානය වන නමුත් මෙහිදී නම් එය ලබා ගැනීම අසීරු බව පෙනේ. විශාල ප්‍රචාරයක් ලබා දීමට ක්‍රියා කල නමුත් ප්‍රජාවගේ සහභාගිත්වය සහිතව පැවත්විය යුතු රැස්වීම් මුළු දෙන්නේ හිස් කාමර තුළ ය. මහජන සහයෝගය සහ සහභාගිත්වය වෙනුවට, ප්‍රජාව පදනම් කර ගත් සේවා කටයුතු දෙස නොසැලකිල්ලෙන් බැලීම සහ උපහාසාත්මකව බැලීම, උතුරු අයර්ලන්තයේ ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ ලක්ෂණ බවට පත්ව තිබේ.

## 6 ප්‍රජාව පදනම් කරගත් පොලිස් සේවාව : ක්‍රියාවට නැගීමේ රාමුවක්

ගැටුම් කළමනාකරණ උපාය මාර්ගයක කොටසක් වශයෙන් පොලිස් ප්‍රතිසංස්කරණවල වැදගත්කම වර්ධනය වන බව සැලකිල්ලට ගැනීමේදී සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නංවන සංවිධානවල ව්‍යාප්තිය සැලකිල්ලට ගැනීමේදී, ප්‍රතිසංස්කරණ ව්‍යුහගත කිරීමේදී එහි අක්ෂය ලෙසින් ක්‍රියා කරන සැකිල්ලක් තිබීම අත්‍යවශ්‍ය වේ. පොලිස් සේවා ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය එබඳු සැකිල්ලක් තවමත් සකසා නොමැති බව ප්‍රථම දිනයේ සාකච්ඡාවේදී අනාවරණය විය.දෙවැනි දිනයේ පැවති විචාරණවල අරමුණ වූවේ, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා වැඩ සටහනක් ක්‍රියාවට නැගිය යුත්තේ කෙසේ, කවදා, කවුරුන් සමගද යන්න ගැන මග පෙන්වීමක් සැපයීමය.

කළමනාකරණය, සන්දර්භයේ අදාල බව සහ සැලසුම්කරණය ගැන විශේෂ අවධානය යොමු කරන,

ක්‍රියාවට නැඟීමේ සැකිල්ලක් වැඩ මුළුවට සහභාගි වූ අය විසින් සකසන ලදි. ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව ක්‍රියාත්මක කිරීමේදී, එහි පවතින සන්දර්භයේ ඇති සුවිශේෂී ලක්ෂණ හඳුනා ගැනීම, සැලසුම්කරණ ක්‍රියාවලියේදී සිදු විය යුතුය. සන්දර්භයට අනුව සුදුසු කාලය සහ කාර්යයේ දිග ප්‍රමාණය, වඩාත්ම අදාළ ආරම්භක ලක්ෂ්‍යය (නිදසුන් : වැඩ කටයුතු ආරම්භ කළ යත්තේ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම මගින්ද, නැතහොත් ප්‍රාදේශික නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින්ද නොඑසේනම් ඒ දෙකම මගින්ද යන්න.) සහ නිශ්චිත පොලිස් සේවා අංශ (නිදසුන් : දූෂණය හෝ මානව හිමිකම් උල්ලංඝනය) කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුද යන්න තීරණය කළ යුතු ය. කාර්යයට මග පෙන්වන ප්‍රධාන මූල ධර්ම අටක් හඳුනා ගැනීම තුළින් සැකිල්ල ආරම්භ වන අතර ඉන් පසුව සාර්ථකත්වය සඳහා බලපාන තීරණාත්මක සාධක රැසක් දැක්වෙයි. මෙම සාධක මුළුමනින්ම පැවතීම හෝ අර්ධ වශයෙන් පැවතීම මගින් සාර්ථකත්වයට ඇති අවස්ථා සැහෙන මට්ටමකින් වර්ධනය වේ.

ක්‍රියාත්මක කිරීමේ සැකිල්ල ඉන් පසුව අදියර හතරකට බෙදනු ලැබේ; එවා නම්; කටයුතු ඇරඹීමට පූර්ව විශ්ලේෂණය සහ තක්සේරුව, සැලසුම්කරණය, දියත් කිරීම කළමනාකරණය සහ ඇගයීම හා නැවැත්වීම වේ.

## අ) ප්‍රධාන මූලධර්ම

නියමිත කාර්යයේ සියළු අදියර සඳහා අදාල වන මූල ධර්ම ගණනාවක් වේ:

1 ජාත්‍යන්තර කාරකයන්ගේ කාර්ය භාරය වන්නේ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයට සහාය වීම සහ පහසුකම් සැපයීම විනා එය මෙහෙයවීම හෝ පාලනය කිරීම නොවේ. ප්‍රායෝගිකව යොදා ගත හැකි උපරිම දේශීය පාර්ශවකරුවන් ප්‍රමාණයක්, සැලසුම්කරණය. ක්‍රියාවට නැගීම. අධීක්ෂණය සහ ඇගයීම් ක්‍රියාවලිය සඳහා දායක කර ගත යුතුය.

2 සැකිල්ල සන්දර්භයට ගැලපෙන ලෙස සැකසිය යුතුය. මේ සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය පුරාම නම්‍යශීලි, පාරදෘෂ්‍ය සහ සාකච්ඡාමය ප්‍රවේශයක් පැවතිය යුතුය.

3 ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ පාර්ශව දෙකටම, එනම් පොලීසියට සහ මහ ජනතාවට, ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. එකකට වඩා අනෙකට ප්‍රධානත්වය දෙන ක්‍රියාවලියක් පක්ෂග්‍රාහී වේ.

4 සම්බන්ධ වන අන්තර් ජාතික ආයතන සහ අදාල දේශයේ රජය අතර පොදු අවබෝධයක් තිබිය යුතුය. මෙය ආරම්භයේ පටන්ම සපුරා ඉටු නොවුනහොත් එමගින් අසංගත භාවය, එකම දේ යළි යළි සිදු කිරීම. සහ අවුල් සහගත බව පැන නැගීමේ අවදානමත් පවතී.

5 විවිධ තලවල පොලිස් නිලධාරීන් (ඉහළ කළමනාකාරිත්වයේ නිලධාරීන් පමණක් නොව) ක්‍රියාදාමයේ සියළු අදියරවලදී දායක වීම. තිරසර භාවය සඳහා තීරණාත්මක වේ.

6 ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව හදෙකලාව සිදු විය යුතු දෙයක් නොවන අතර,, එය අපරාධ යුක්ති රටාවේ පුළුල් ප්‍රතිසංස්කරණයක කොටසක් විය යුතුයි. මෙහි අර්ථය නම් උපදෙස් ලබා ගැනීම සඳහා සහ තක්සේරු කිරීම සඳහා මෙන්ම වෙනත් වැඩ සටහන් සමග එක්ව ක්‍රියා කිරීමද සඳහා වෙනත් අපරාධ යුක්ති ආයතනවල ප්‍රධාන ක්‍රියාකාරිකයන් ඇතුළත් කර ගත යුතු බවය.

7 වැඩ සටහන යථාර්ථවාදී විය යුතු අතරම පවතින සම්පත්වලට ගැලපෙන එකක් විය යුතුය.

8 ශක්‍යතා වර්ධනය තීරණාත්මකව වැදගත්ය. අන්තර් ජාතික අනුග්‍රහය අවසන් වූ පසුවද ප්‍රගතිය පෙරට යා යුතුය.

## ආ) සාර්ථකත්වයේ තීරණාත්මක සාධක

මෙම සාධක ශක්තිමත්ව පවතින ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව ක්‍රියාවට නැගීමද හොඳින් සිදුවේ.

### 1 රටේ අවම ප්‍රමාණයේ විනයක්

පොලිස් ප්‍රතිසංස්කරණ සිදු කිරීමට යම් අවකාශයක් ලබා ගනු වස්, රට තුළ කෙටි කාලයක සිට මධ්‍යම කාලයක් දක්වා පවතින යම් ආකාරයක අවම මට්ටමේ විනයක් හෝ තිබීම අත්‍යවශ්‍ය වේ. කඩිනමින් ස්ථානගත කොට මෙම වාතාවරණයන් තුළ කටයුතු කිරීමට අවශ්‍ය උපකරණ සහ අනෙකුත් සේවාවන් සූදානම්ව

තබා ගෙන එබඳු අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම සඳහා අන්තර් ජාතික මැදිහත් වීම යුහුසුළුව සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

## 2. යෝග්‍ය සන්දර්භයක් සහ වෙනස්වීමක් සඳහා දේශපාලන අධිෂ්ඨානය ප්‍රදර්ශනය වීම

රජයේ සහ පොලීසියේ යන දෙපාර්ශවයේම ශ්‍රේණීන් තුළ සිටින නායකයන් අතර. මෙබඳු පොලිස් ප්‍රතිසංස්කරණයන් සඳහා ජාතික වශයෙන් යම් දේශපාලන අනුග්‍රහයක් දැක්වීම අවශ්‍ය වේ. මුලින්ම පොලිසියේ ඉහළ මට්ටම්වල නිලධාරීන්ගේද අනතුරුව මධ්‍යම මට්ටමේ කළමනාකාරීත්වයේ සහ පහළ මට්ටම්වල නිලධාරීන්ගේද කැමැත්ත මේ සඳහා ලැබිය යුතුය. පොලිස් සේවය තුළ සිදුවන මානව හිමිකම් උල්ලංඝනය සහ බලය අධික ලෙස භාවිත කිරීම බඳු ගැටළු (සංකේතාත්මකව බලවත්) ගැන පොලීසියේ නිලධාරි තන්ත්‍රය විසින් ගනු ලබන පියවර දැක්වෙන සංඛ්‍යාලේඛන; ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට සහාය වශයෙන් සම්පත් ප්‍රතිපාදනය; සහ පොලීසිය මහ ජනයා හමුවේ වග වග වීමෙන් ක්‍රියා කිරීමේ ස්වභාවය වර්ධනය කිරීම මගින් පොලිස් -ප්‍රජා සම්බන්ධතා වර්ධනය කිරීමට රජයේ පාර්ශවයෙන් දක්වන කැමැත්ත මැන බැලිය හැකිය.

එබඳු ක්‍රියාමාර්ග සහ කැපවීම් ගැන රට තුළ සිටින ජාත්‍යන්තර තානාපති අංශ, දේශිය පාර්ලිමේන්තු නියෝජිතයන් සහ අන්තර් ජාතික සහ දේශීය සිවිල් සමාජ සංවිධාන ඇතුළු අනෙකුත් දැනුවත් කාරකයින් විසින්ද, අන්තර් ජාතික සහ දේශීය මානව හිමිකම් සංවිධාන විසින්ද ස්ඵුට කළ හැකිය.

## 3. පොලිස් සේවය තුළ මූලික කළමනාකරණ කුසලතා

ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සිදු කිරීම සඳහා මූලික කළමනාකරණ ශක්‍යතාවක් අවශ්‍ය වේ. කලමනාකරණ කුසලතා නොමැති නම්, මෙය ශක්‍යතා වර්ධනයේ ප්‍රමුඛතාව ලෙසින් සළකා ක්‍රියා කල යුතුය.

## 4. සිවිල් සමාජ දායකත්වය

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව සාර්ථකව ක්‍රියාවට නැගිය හැක්කේ යම් ආකාරයක මහජන හෝ සිවිල් සමාජ කොටස්කරුවෙකු හවුල් කර ගැනීමට පොලීසිය සමත් වෙතොත් පමණකි. පොලීසියද සමග ආරක්ෂාව සහ රැකවරණය පිළිබඳ ගැටළු අරබයා ක්‍රියා කිරීමට නම් කිසියම් මට්ටමක සිවිල් සමාජ ශක්‍යතාවක් අවශ්‍ය වේ. මෙය කිරීමට හැකි වන ආකාරයේ දේශපාලන අවකාශයක් පවතින බව ඔවුන්ට තහවුරු කළ යුතුය.

## 5. ආධාර කණ්ඩායම්වල සහාය සහ සම්බන්ධීකරණය.

අන්‍යෝන්‍ය සහාය ඇතිව තම වැඩ සටහන්, උපාය මාර්ග සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා ආධාර කණ්ඩායම් අතර සුදානමක් තිබිම ඉතා වැදගත්ය. මධ්‍යම කාලීන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිවල සිට දිගු කාලීන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලි දක්වාම ආධාර කණ්ඩායම් කැපවී සිටීමත්, ප්‍රමාණවත් සම්පත් සැපයීමත්, ඉටු කර ගත නොහැකි අපේක්ෂා නිර්මාණය කිරීම වැලක්වීම උදෙසා වැදගත්ය.

# ඇ) ක්‍රියාත්මක කිරීමේ ආකෘතිය

### අදියර 1 :- කාර්යය ඇරඹීමට පූර්ව විශ්ලේෂණය සහ තක්සේරුව

අපේක්ෂිත කාර්යය සැලසුම් කිරීම, සැලසුම් සැකසීම, ක්‍රියාවට නැගීම, අධීක්ෂණය සහ ඇගයීම සියුම් සහ පරිපූර්ණ ආකාරයට කිරීම සඳහා පූර්ණ සන්දර්භ විශ්ලේෂණයක් සහ අවශ්‍යතා සම්පත් තක්සේරුවක් සිදු කිරීම අත්‍යවශ්‍යය. තමන්ද අර්ථවත් ආකාරයට දායකත්වයක් දැක්වී යයි පොලීසියට, රජයට සහ සිවිල් සමාජයට සෑහීමකට පත් විය හැකි ආකාරයට, හැකි තාක් පුළුල් සහ සාකච්ඡාමය ස්වභාවයකින් යුතුව තක්සේරු කිරීමේ කියාවලිය ඉටු කළ යුතුය. තක්සේරු කිරීමේ කාර්යය තකහනියේ සිදු නොකිරීමත්, ඒ සඳහා පැමිණෙන කණ්ඩායම අවශ්‍යතා සහ ප්‍රමුඛතා පිළිබඳව පූර්ව-අනුමාන සහ නිගමනවලින් තොරව පැමිණීමත් වැදගත්ය.

පොලීසිය සහ අපරාධ පිළිබඳව පටු ආකාරයට සළකා බැලීමෙන් ඔබ්බට ගොස්. පොලීසිය සහ ප්‍රජාවන් අන්තර් සම්බන්තා පවත්වන පුළුල් සමාජ. ආර්ථික සහ දේශපාලන තත්ත්වයන් සොයා බැලිය යුතුය. තක්සේරු කාර්යයේ නිරත වන පුද්ගලයන් සතුව පුළුල් දක්ෂතා තිබිය යුතුය; එසේම පොලිස් අත්දැකීම් සහිත තක්සේරුකරුවන් තමන් හමුවේ ඇති සමාජය හා බැඳුණු සමාජ විද්‍යාත්මක දැනුම සහිත අය විය යුතුය. එසේම ඉදිරියේ ක්‍රියාත්මක වීමට නියමිත වැඩ සටහන මූල්‍යමය යථාර්ථයක් සහිත එකක් වන බැවින්. මූල්‍ය

කටයුතු පිළිබඳ පසුබිමක් සහිත අය ද ඊට ඇතුළත් විය යුතු ය.

පොලිස් කටයුතු හා බැඳෙන ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ අංශය ගැනද ආරක්ෂාව, රැකවරණය සහ අධිකරණ කටයුතු සඳහා කාන්තා ප්‍රවේශයට සම්බන්ධ ගැටළු ගැනද තක්සේරු සහ විශ්ලේෂණය තුළදී අවධානය යොමු කල යුතුය. කාන්තාවන්ගේ ජීවිත සහ සමාජ තත්වයට මහත් සේ බලපාන සමහර ගැටළු පාලනය කෙරෙන්නේ සම්ප්‍රදායික නීතිය සහ ආගමික භාවිතාවන් මගින් වන හෙයින් මෙය විශේෂයෙන්ම වැදගත්වේ. දේපල හිමිකාරීත්වය, වැන්දඹු කාන්තාවන්ගේ සහ ළමුන්ගේ තත්වය ඇතුළු විවාහය සහ දික්කසාද, ළමා භාරකාරීත්වය, සුජාතභාවය සහ කුල වැද්දුම් කිරීම සහ ප්‍රාන්ත/පළාත් අතර පරිපාලනය ආදිය මෙයට ඇතුළත්ය. අධිකරණය කරා කාන්තා ප්‍රවේශය යන්නට, ඔවුන්ගේම පවුල් සහ ඔවුන් ජීවත්වන ප්‍රදේශයේ ඇති සම්ප්‍රදායික ව්‍යුහයන් මෙන්ම පොලීසිය, අධිකරණයට සම්බන්ධ පුද්ගලයන්. මහේස්ත්‍රාත්වරුන් සහ දිස්ත්‍රික් පරිපාලනයේ පුද්ගලයන්ද ඇතුළත් විය යුතුය.[7]

තක්සේරුව සම්පූර්ණ වීමට නම් එය අංග නවයකින් සමන්විත විය යුතු යඃ

## 1.1 අවදානම් සහ ගැටුම් විශ්ලේෂණය

අනාරක්ෂිත භාවය සහ අපරාධ ඇති වීමේ හේතු වටහා ගැනීමට අවශ්‍ය සන්දර්භය රට තුළ පවතින පුළුල් සමාජ ආර්ථික සහ දේශපාලන තත්ව අධ්‍යයනයක් මගින් සැපයෙන අතර, පොලිසියේ ක්‍රම සහ භාවිතාවන් එසේ පැවතීමට ඇති හේතුවලින් සමහරක් ගැන පැහැදිලි කිරීමක්ද එමගින් සැපයෙයි. අපේක්ෂා කරන ලද කාර්යය සමස්තයක් වශයෙන් සමාජයටම බලපාන බැවින්, එහි සාධනීය බලපෑම් උපරිම කිරීමත්, නිශේධනීය බලපෑම් අවම කිරීමත් සඳහා යම් අවධානයක් යෙදවිය යුතු ය.

- ප්‍රචණ්ඩ ගැටුම් පැන නැගිය හැකි (සංක්‍රමනීය සමාජ) හෝ එබඳු ගැටුම් පැන නැගුණු (පශ්චාත් ගැටුම් සමාජ) ව්‍යුහාත්මක වූ ද, නිශ්චිත සිදුවීම්වලට සහ කාරකයන් සම්බන්ධ වූ ද, සමාජ, ආර්ථික සහ දේශපාලන ගැටළු.
- ගැටුම් හේතුවෙන් පොලීසියේ සංවිධාන ව්‍යුහය, සැකැස්ම සහ විධි ක්‍රම කෙරෙහි ඇති වූ බලපෑම
- මෙම පුළුල් ගැටුම් හේතුවලට පිළියම් යොදන මාර්ග.

## 1.2 අපරාධ ප්‍රවණතා විශ්ලේෂණය

රටේ පවතින අපරාධ ගැටළු ද ඒවායේ සමාජ හා ආර්ථික පිරිවැය ද තක්සේරු කල යුත්තේ ලබා ගත හැකි දත්ත ප්‍රමාණයන් මත පදනම් වෙමිනි. අනෙකුත් තක්සේරු කිරීම් සහ විශ්ලේෂණ සමග හරි වැරදි සසඳා බැලීමෙන් පසු ඒවා සමග ඒකාබද්ධ කළ මෙම තොරතුරු මගින් අපරාධ සහ අනාරක්ෂිත භාවය ගැන පවතින හැඟීම්/සංජානනයන් මැන ගත හැකි වේ. එසේම ප්‍රතිසංස්කරණ කාල පරිච්ඡේදය මුළුල්ලේම අපරාධ/අපරාධ ප්‍රවණතා මැන ගැනීමේ මූලික දර්ශක වශයෙන් ද ඒවා යොදා ගත හැක. අපරාධ පිළිබඳ සංඛ්‍යා ලේඛන නොපැවතිය හැකි නිසාත්, තිබෙන සංඛ්‍යා ලේඛන වුවද විශ්වාසනීය ඒවා නොවන නිසාත්, ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක දර්ශක ද යොදා ගත යුතු ය. එපමණක් නොව මෙම සංඛ්‍යා ලේඛන හරහා අපරාධවල සැබෑ මට්ටම පිළිබඳව නිවැරදි චිත්‍රයක් ඉදිරිපත් වීමට ඇති අවකාශ ද අල්ප ය. මන්ද යත්, මෙම සංඛ්‍යා දත්ත සැකසෙන්නේ පොලීසියට ඉදිරිපත් වූ පැමිණිලි ඇසුරෙන් පමණක් වන බැවිනි. ගැඹුරු ලෙස බෙදී ගිය සමාජවල බොහෝ දෙනෙක් එසේ පොලීසියට පැමිණිලි ඉදිරිපත් කිරීම පිළිකුල් කරති. එබැවින් පොලීසියට ලැබෙන අපරාධ පිළිබඳ පැමිණිලි සංඛ්‍යාවට වඩා සැබෑ අපරාධ සංඛ්‍යාව වැඩි විය හැක. එබැවින් මහ ජනයාට බලපාන ගැටළු ගැන පුළුල් අදහසක් ගොඩ නගා ගැනීම සඳහා, මහජන අදහස් සමීක්ෂණ, මාධ්‍ය වාර්තා සහ සිදුවීම් පිළිබඳ විස්තර වැනි වෙනත් ආකාර මෙවලම් ද භාවිතා කළ යුතු ය. අපරාධ ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණය තුළින් පහත සඳහන් දෑ ඉදිරිපත් කල යුතු ය.

- ප්‍රධාන අපරාධ ගැටළු සහ ඒවායේ මූලයන්;
- කලාපීය, ග්‍රාමීය සහ නාගරික විශේෂතා කරා ප්‍රවිෂ්ඨ වීම;
- නිශ්චිත සමාජ කණ්ඩායම් (නිදඃ කාන්තාවන් හෝ නිශ්චිත ආගමික හෝ වාර්ගික කණ්ඩායම්) හා සම්බන්ධ සුවිශේෂ ගැටළු ගැන තක්සේරුවක් ඃ
- ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ ගැටළුවලට ආමන්ත්‍රණය කිරීමේ දි පොලීසිය සහ වෙනත් සමාජ ව්‍යුහයන්ගේ (නිදඃ යුක්තිය පසිඳ ලීමේ සම්ප්‍රදායික ව්‍යුහයන් සහ අධිකරණය) කාර්ය භාරය.
- මෙම ගැටළුවල මුල් - ඒවා හුදෙක්ම අපරාධ හා බැඳුණු ඒවා ද නැතහොත් ගැටුම් හා බැඳුණු ඒවා ද එසේත් නැතහොත් ඒ දෙකම මිශ්‍ර වීමක් ද යන වග

7 **Overview of the Gendered Dynamics in Accessing justice in WLSA countries (Botswana, Lesotho,Malawi, Mozambique, Swaziland, Zambia and Zimbabwe)** පර්යේෂණ සහ අධ්‍යාපන භාරයේ, දකුණු අප්‍රිකාව තුළ කාන්තාව සහ නීතිය (WLSA ) සංවිධානයේ සාරා මිවුඩුඩූ විසින් 2001 ජූනි 26-28 තුළ ලන්ඩන් නගරයේ පැවති අධිකරණ කටයුතු ප්‍රජාතාන්ත්‍රික කිරීම නම් සම්මන්ත්‍රණයට ඉදිරිපත් කළ ලේඛනය.

- අපරාධවල ආර්ථික හා සාමාජීය පිරිවැය තක්සේරු කිරීම.

## 1.3 පොලිස් සංවිධානය පිළිබඳ තක්සේරුව

පොලීසියේ විද්‍යාමාන වන ශක්තිය හා දුබලතා ගැන තක්සේරු කර ගැනීමත්. වෙනස්කම් උකහා ගැනීමට පොලීසියේ ඇති ශක්‍යතාවය ගැන තක්සේරු කර ගැනීමත් වැදගත්ය. පොලිස් දෙපාර්තමේන්තුවේම පුද්ගලයන් (සංවිධානයේ සියළු ස්ථරවල සිටින ) පිළිබඳව විස්තරයක් ද තම සංවිධානය, එහි කළමනාකාරීත්වය සහ ඔවුන්ගේ කාර්ය භාරය ගැන ඔවුන් තුළම ඇති ආකල්ප පිළිබඳ සමීක්ෂණයක් ද මෙම තක්සේරුවේ කොටසක් වශයෙන් ඇතුළත් විය හැකිය. තක්සේරුව මගින් :

- වත්මන් පොලිස් සේවයේ/සංවිධානයේ ව්‍යුහයන්, සම්පත්, බලතල සහ ශක්‍යතා පිළිබඳව, දේශපාලන ආයතන සමග එහි ඇති සබඳතා ගැන ද විස්තර විය යුතු ය.
- පොලිස් සංවිධානය ඇතුළත පවතින විධිමත් හා අවිධිමත් සංස්කෘතීන් සහ ආකල්ප ගැන තක්සේරු කළ යුතු ය.
- පොලිසියේ මූල්‍ය සම්පත් හා ඒවා කළමනාකරණය කළ යුතු ආකාරය ගැන ඇගයීමට ලක් කල යුතු ය.
- දූෂණ මට්ටම සහ ඒවායේ හේතු ගැන අවධානය යෙදවිය යුතු ය.
- පොලිසියේ අභ්‍යන්තර සංනිවේදන ක්‍රමය ඇගයිමට ලක් කළ යුතු ය.

## 1.4 පොලිස් කටයුතු පිළිබඳව පවතින අදහස් ගැන මූලික සමීක්ෂණය

ප්‍රධාන ආරක්ෂක සහ රැකවරණ ගැටළු පිළිබඳ අදහ-ස් ලබා ගැනිමත්, පොලීසිය විසින් එකී ගැටළු විසඳීම සඳහා ගත හැකි සහ ගත යුතු පියවර ගැන අදහස් ලබා ගැනීමත් සඳහා, පොලීසිය සහ මහ ජනතාව යන දෙකොටසම සමග සාකච්ඡා කළ යුතු ය. අදහස් සමීක්ෂණය මගින් පහත සඳහන් කරුණු පිළිබඳව මැන බැලීමට හැකි විය යුතු ය.

- රටේ පවතින පොලිස් කටයුතු සම්බන්ධ ගැටළු (නිද : දූෂණය, සංවිධිත අපරාධවලට හවුල් වීම, මහජන විශ්වාසය නොමැති වීම, පොලීසිය සහ සන්නද්ධ සේවා අතර ඇති වගකීම් නිශ්චිත නොවන ලෙස බෙදීම);
- පොලිසිය විසින් සමාජයේ සියළු සාමාජිකයන්ට සැලකීම;
- පොලීසිය විසින් වටහා ගත් ආකාරයට ඔවුන්ගේ ප්‍රමුඛතා;
- පොලිස් ප්‍රමුඛතා ගැන මහජන අදහස්;
- පොලීසිය වෙතින් මහ ජනයා අපේක්ෂා කරන දේ;
- පොලිසිය සහ මහ ජනතාව අතර පවතින සම්බන්ධතාවයේ ස්වරූපය;

## 1.5 නෛතික සහ ආඥාදායක ක්‍රම ව්‍යවස්ථාමය ආකෘතිය පිළිබඳ සමාලෝචනය

පොලීසියේ ක්‍රියාකාරීත්වය රඳා පවත්නා නෛතික ආඥාදායක ක්‍රම ව්‍යවස්ථාමය සහ පරිපාලනමය ආකෘතිය සමාලෝචනයට ලක් කල යුතු ය. බලය ලැබෙන නෛතික සහ ආඥාදායක ක්‍රම ව්‍යවස්ථාමය ආකෘතියක් පවති නම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පහසු වෙයි. ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවකට සහාය වීම උදෙසා අවශ්‍ය ආඥාදායක ක්‍රම ව්‍යවස්ථාමය සහ ව්‍යවස්ථාපිත ප්‍රතිසංස්කරණ කවරේද යන්න තක්සේරු කර ගැනීම සඳහා මෙම සමාලෝචනය උපකාරී වේ. සමාලෝචනය තුළ පහත සඳහන් කරුණු අඩංගු විය යුතු ය.

- පොලීසියේ හැසිරීම් නෛතිකව පාලනය කරන ක්‍රියාකාරකම්, ආචාර ධර්ම සහ නීති රීති;
- පොලිස් කටයුතු, රැකවරණය සහ ආරක්ෂාවට සම්බන්ධ කලාපීය හෝ අන්තර් ජාතික රටාවන් සහ ප්‍රඥප්ති (නිද : මානව හිමිකම් ප්‍රඥප්තිය );
- පොලීසියේ කාර්ය භාරය ගැන ආඥාදායක ක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන අර්ථ නිරූපණය;
- ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක් ඇති කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාමය වෙනස්කම්;

## 1.6 පොලීසියත් පුළුල් අපරාධ යුක්ති සහ ආරක්ෂක අංශත් අතර ඇති සම්බන්ධතාවය

ආරක්ෂක අංශ අතරින් වඩාත්ම පැහැදිලිව පෙනෙන ආයතනය පොලීසිය වන අතර, එය අපරාධ යුක්ති ක්‍රමය තුළ ඇති එක් වැදගත් අංගයක් ද වේ. එබැවි-න් පොලීසිය සහ මේ අංශයේ වෙනත් කොටස් අතර පවතින සම්බන්ධතාවය ද කාර්ය භාරය ද හඳුනා ගැනීම වැදගත් ය. ඒ සඳහා ඇගයීමට භාජනය කළ යුතු අංග වන්නේ :

- පුළුල් අපරාධ යුක්ති අංශය (උසාවි සහ දණ්ඩන ක්‍රමය) සහ පොලීසිය සමග එහි ඇති සම්බන්ධතාවයේ ස්වභාවය;
- පොලිසිය සහ වෙනත් ආරක්ෂක අංශ අතර සම්බන්ධය ඃ නිදඃ සන්නද්ධ සේවා සහ ඔත්තු සේවා;
- ප්‍රජාව පදනම් කර ගත් පොලිස් ප්‍රතිසංස්කරණ සම්පූර්ණ කර ගැනීමේ අටියෙන් සම්බන්ධ කර ගත යුතු, පුළුල් අපරාධ යුක්ති ක්‍රමය සහ/හෝ ආරක්ෂක ක්ෂෙත්‍රය තුළ ඇති අනෙකුත් අංශ සමග පොලීසියේ සම්බන්ධතාවය;

## 1.7 රැකවරණය සහ ආරක්ෂාවට අදාල වන වත්මන් සමාජ සහ පාලන ව්‍යුහයන් සමාලෝචනය කිරීම

මහජන ආරක්ෂාව සහ රැකවරණය අරහයා ක්‍රියා කරන ශක්තිමත් එහෙත් නිල නොවන යාන්ත්‍රණ බොහෝ සමාජවල දක්නට ලැබේ. එබඳු සමාජවලදී නිල පොලිස් ව්‍යුහයන්, ප්‍රධාන වශයෙන්ම මහ ජනතාවගෙන් වෙන්ව පවතී. නවතම ව්‍යුහයන් සකස් කරනු වෙනුවට දැනට පවතින ව්‍යුහයන්ම, පොලිසිය සහ ප්‍රජාව අතර විශ්වාසය පෝෂණය කිරීම සඳහා භාවිතා කිරීම හෝ ඒවා යලි පණ ගන්වා ගැනීම වඩාත් තිරසාර ක්‍රියාවකි. මෙම යාන්ත්‍රණ කවරේ ද යන්නත් ඒවායේ සුජාත භාවයේ මට්ටම ද ආරක්ෂාව සහ රැකවරණය කෙරෙහි ඒවායේ ඇති සාධනීය හා නිශේධනීය දායකත්වය ද අවබෝධ කර ගැනීම ඉතා වැදගත් ය. එසේ සිතියම් ගත කිරීමේ ක්‍රියාවලිය තුළ අඩංගු කරුණු ඃ

- මහජන ආරක්ෂාව සහ රැකවරණයද, ගැටුම් නිරාකරණය ද ගැන ක්‍රියා කිරීමට ප්‍රයත්න ව්‍යුහයන් (නීත්‍යානුකුල සහ ගැටළුකාරී ව්‍යුහයන් ද ඇතුළුව, උදා ඃ ගමේ වැඩි මහළු අය බඳු සම්ප්‍රදායික ව්‍යුහ, සුපරීක්ෂක කණ්ඩායම්, යාබද ප්‍රදේශවල මුර සංචාර, පුද්ගලික ආරක්ෂක සමාගම් ආදිය);
- රටේ නීත්‍යානුකුල රාමුව තුළට, නිල නොවන යාන්ත්‍රණ ඇතුළත්ව ඇති ප්‍රමාණය, ඒවායේ සුජාත භාවය / සහාය සහ බලපෑමේ /ප්‍රතිඵල බිහි කිරීමේ මට්ටම;
- මහජන ආරක්ෂාව සහ රැකවරණය සඳහා රාජ්‍ය අරමුදල් සපයනු ලැබ බිහිවී ඇති විධිමත් / අවිධිමත් ව්‍යුහයන් අතර සම්බන්ධය / සහයෝගය (නිද ඃ පොලීසිය, අධිකරණ පද්ධතිය ආදිය ) ;
- ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව ක්‍රියාවට නැගීමේ පුළුල් වැඩ සටහනක් තුළට, අදාල වත්මන් ව්‍යුහයන් ඇතුළත් කර ගැනීමේ අවස්ථා සහ අභියෝග;

## 1.8 පාර්ශවකරුවන් සහ නායකත්ව විශ්ලේෂණය

ඕනෑම ආකාරයක ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් තිරසාර වීමට නම්, ප්‍රාදේශික පාර්ශවකරුවන්ගේ සහ නායකයන්ගේ දායකත්වය සහ ප්‍රගතිගාමී සහාය තීරණාත්මක වේ. පොලීසිය, රජය, සහ සිවිල් සමාජය තුළ සිටින (ජාතික, කලාපිය, දිස්ත්‍රික්ක, නාගරික ආදි මට්ටම්වල) ප්‍රධාන පුද්ගලයින් කවුද යන්න පිළිබඳව පැහැදිලි අදහසක් ප්‍රතිසංස්කරණය සිදු කරන පුද්ගලයන් තුළ තිබිය යුතුයි. එසේම මතු දැක්වෙන කොටස් පිළිබඳවද ඔවුන් තුළ පැහැදිලි අවබෝධයක් තිබීම අත්‍යවශය ය.

- ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා කටයුතු ආරම්භ කිරීමට පියවර ගන්නා ප්‍රධාන පාර්ශවකරුවන් (පොලිසිය, ප්‍රජා ව්‍යුහයන්, පුළුල්ම සහයෝගිත්වයක් සහිතව සිවිල් සමාජය, පාර්ලිමේන්තුව, පුද්ගලික අංශය, රජය ආදිය)
- ප්‍රතිසංස්කරණවලට පක්ෂපාතී පාර්ශවකරුවන් (වෙනස් කිරීමේ නියෝජිතවරු)
- ප්‍රතිසංස්කරණවලට එරෙහි පාර්ශවකරුවන්ගෙ (නරක් කරන්නෝ) සහ ඔවුන් එකඟ කරගත හැකි ආකාරය

## 1.9 මූල්‍ය කටයුතු තක්සේරුව සහ ස්වශක්තතාව (ගැලපීම)

මූල්‍යමය වශයෙන් තිරසාර නොවන ප්‍රතිසංස්කරණ වැඩ සටහනක් සැලසුම් කිරීමෙන් කිසිවෙකුට පලක් නැත. එහෙයින් සම්පත් ප්‍රතිපාදනය සහ අය වැය සැකසීම පිළිබඳ යථාර්ථවාදී තීරණවලට එළඹීමට නම්, පළාත් පාලන ආයතනවල සහ පොලිස් සංවිධානයේ මූල්‍යමය අවශ්‍යතා සහ අන්තර් ග්‍රහණ ශක්‍යතාව පිළිබඳ නිවැරදි තක්සේරුවක යෙදීම අත්‍යවශ්‍ය ය. එහෙයින් තමන්ට කළමනාකරණය කර ගැනීමේ හැකියාවක් හෝ දිගු කාලීන වශයෙන් තිරසාර හෝ නොවන සම්පත් මගින් රජයට සහ පොලීසියට අනවශ්‍ය බරක් පටවනු වෙනුවට, දැනට පවතින ජාතික සම්පත් කාර්‍යක්ෂම, ඵලදායක සහ පිරිමැසුම්දායක ආකාරයට භාවිතා කිරීම කෙරෙහි දිරි ගැන්විය යුතුය. මූල්‍ය කටයුතු තක්සේරුවේ ප්‍රධාන කරුණු තුළ මේවා අඩංගුය.

- අන්තර් ජාතික මූල්‍ය සහයෝගයේ මට්ටම;
- අදාල රටේ රජයේ සහ පොලීසියේ අන්තර්ග්‍රහණ හැකියාව;
- සම්පත් භාවිතා කිරීමේ ප්‍රමුඛතා;
- අන්තර් ජාතික සම්පත් සමග යොදා ගත හැකි දේශීය සම්පත්;
- ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක් ඇති කිරීමට අවශ්‍ය අතිරේක මූල්‍ය සම්පත්;

### අදියර 2:- වැඩ සටහන් සැකසුම සහ සැලසුම් සැකසීම

වැඩ සටහනේ උපාය මාර්ග සහ ප්‍රමුඛතා ක්‍රමවත්ව දැක්වීමේ අටියෙන්, වැඩ සටහන් සැලසුම් කිරීම සහ සැලසුම් සැකසීම පදනම් විය යුත්තේ මෙයට පෙර සිදු කළ තක්සේරු කිරීම් සහ විශ්ලේෂණ මත වේ. අදියර 2 දී ද මෙයට පෙර අදියර තුළදී මෙන්ම ප්‍රාදේශීය බලධාරීන් සමග සාකච්ඡාමය ප්‍රවේශය අඛණ්ඩව පවත්වා ගත යුතුය. වැඩ සටහනේ නිශ්චිත ස්වභාවය නිසා එක් එක් පාර්ශවයේ වගකීම් පිළිබඳව ආධාර කණ්ඩායම් / අන්තර් ජාතික ක්‍රියාකාරිකයන් සහ රජය පැහැදිලි එකගත්වයකට එළඹිය යුය. අවශ්‍ය අවස්ථාවලදී එවක පවතින සන්දර්භයට උචිත ලෙස අනුගත වීමට අවශ්‍ය නම්‍යශීලී භාවය රඳවා ගන්නා අතරම, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ ලක්ෂණ සහ මූලධර්ම පිළිබඳව, අදාල සියළු පාර්ශවයන් පැහැදිලිව වටහා ගැනීමද එපමණටම වැදගත්ය. ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමේදී ප්‍රධාන වශයෙන්ම වගකීම් පැවරෙන්නේ මධ්‍යම මට්ටමේ සහ පහළ මට්ටමේ නිලධාරීන්ට වන බැවින්, සැලසුම් සැකසීමේ අදියරේදී ධූරාවලියේ ඉහළ සාමාජිකයන්ගේ සේම ඔවුන්ගේද දායකත්වය ලබා ගත යුතුය. පොලීසිය සහ මහ ජනතාව අතර අන්තර් සම්බන්ධතා සපුරා ගත හැකි මට්ටම මෙන්ම අන්තර්ග්‍රහණය කර ගැනීමට සහ වෙනස්කම් සිදු කිරීමට ඔවුන්ට ඇති හැකියාවේ ප්‍රමාණය ගැනද යථාර්ථවාදී ලෙස බැලීම වැදගත් වේ.

සැලසුම් සැකසීමේ අදියර අංග පහකින් සමන්විතය.

### 2.1 කාර්යයේ ප්‍රමුඛතා අර්ථ නිරූපණය කිරීම

කාර්යයේ ප්‍රමුඛතා අර්ථ නිරූපණය කිරීම තුළ මතු සඳහන් දෑ අඩංගුය.

- තක්සේරු කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ අදියර තුළින් මතු වූ ප්‍රධාන ආරක්ෂක සහ රැකවරණ අභියෝග;
- විශේෂිත කලාපයකට හෝ සමාජ කණ්ඩායමකට සම්බන්ධ නිශ්චිත රැකවරණ සහ ආරක්ෂක ගැටළු වැනි අවධානය යොමු කළ යුතු විශේෂිත ක්ෂේත්‍ර;
- ප්‍රජාව / මහ ජනතාව සහ පොලීසිය විසින් විවරණය කළ ආකාරයට පොලිස් සේවාවේ ප්‍රමුඛතා;

### 2.2 මැදිහත් වීමේ අරමුණු සැකසීම

ප්‍රමුඛතා හඳුනා ගැනීමෙන් අනතුරුව, මැදිහත් වීමේ නිශ්චිත අරමුණු ක්‍රමවත්ව දැක්විය යුතුය. මේවා යථාර්ථවාදී මෙන්ම නිශ්චිත විය යුතුය. කළ හැක්කේ කුමක්ද, කවර කාල පරාසයකද, කවුරුන් විසින්ද සහ කාගේ සම්පත් යොදා ගනිමින් ද යන වග.

පහත දැක්වෙන අපේක්ෂිත වෙනස්කම් අරමුණු තුළ අන්තර්ගත විය යුතුය.

- පොලිස් සේවා මාදිලිය සහ කාර්යක්ෂමතාවය;
- ප්‍රජාවගේ කාර්ය භාරය සහ ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවක් සඳහා දායක වීමට ඔවුන් සතු හැකියාව;
- පොලිස් සංවිධානයේ ව්‍යුහය;
- පොලීසිය සහ මහ ජනතාව අතර සම්බන්ධතාවය;
- පොලීසියේ වග වීම;
- පොලීසිය සහ පුළුල් අපරාධ යුක්ති රටාව අතර සම්බන්ධතාවය;

### 2.3 මූල්‍යමය වශයෙන් ශක්තිමත් ක්‍රියාකාරී සැලැස්මක් තිබීම

ප්‍රමුඛතා සහ අරමුණු නිශ්චිත ක්‍රියාකාරකම් බවට පරිවර්තනය කිරීම, මෙම ක්‍රියාකාරකම් අතර කාල අනුපිළිවෙල සැකසීම, සහ නිශ්චිත අරමුණු ඉටු කිරීමේ වගකීම නිශ්චිත ක්‍රියාකාරිකයන්ට පැවරීම, ක්‍රියාකාරී සැලැස්මක් තුළින් අපේක්ෂා කෙරේ. අරමුණු සහ ක්‍රියාකාරී සැලසුම් භාවිතාවට යෙදිය හැකි වන්නේ ප්‍රමාණවත් සම්පත් තිබේ නම් සහ ඒවා කාර්‍යක්ෂමව කළමනාකරණය කළහොත් පමණකි. ක්‍රියාකාරී සැලැස්ම සහ අය වැය තුළ මෙබඳු දේ අඩංගු විය යුතු ය. එනම්

- එක් එක් අරමුණ ඉටු කර ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු නිශ්චිත කටයුතු;
- එක් එක් කටයුත්ත සඳහා වග කිව යුතු නිශ්චිත

පුද්ගලයන්ගේ නම්;
- පිරිවැය සහ මානව සම්පත් අවශ්‍යතා; කාල සීමාව;
- අරමුදල් ලැබෙන මාර්ග (අන්තර් ජාතික සහ දේශීය අරමුදල්);
- කළමනාකරණ වගකීම සහ අය වැය පිළිබඳ අධීක්ෂණ ව්‍යුහය;

## 2.4 නිරීක්ෂණය සහ ඇගයීම පිණිස ප්‍රධාන සන්ධිස්ථාන සහ / හෝ දර්ශක සැපයීම

ක්‍රියාත්මක වීම නිරීක්ෂණය කිරීමට හැකි වනු පිණිස වැදගත් අවස්ථා සහ /හෝ දර්ශක සැකසිය යුතුය. ඒවා යථාර්ථවාදී සරල සහ අඩු වියදම් ලක්ෂණ සහිත විය යුතු අතර, පිහිටුවීමට නියමිත අධීක්ෂණ යාන්ත්‍රණ සහ ව්‍යුහයන් සඳහා ඒවා යොදා ගැනීමට හැකි වීම අත්‍යවශ්‍යය. ක්‍රියාවට නැගෙමින් පවතින අතරම, ප්‍රතිසංස්කරණ කටයුතු සංශෝධනයට ලක් කිරීමට හැකි වනු පිණිස, මධ්‍ය කාලීන සමාලෝචන සහ නිරීක්ෂණ ක්‍රියාවලියක්, සමස්ත නිරීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලිය තුළ අන්තර්ගත කර තිබිය යුතුය. දර්ශක තුළ අන්තර්ගත විය යුතු අංග මෙසේය.

- ප්‍රගතිය මැනීමට හැකි වනු පිණිස සමානාත්මක සහ ගුණාත්මක දර්ශක සමබරව අඩංගු කළ අවශ්‍යතා ලේඛනයක්;
- කිසියම් පුද්ගලයෙකුට වෙනස්කම් ප්‍රමාණය මැන බැලීමට අවශ්‍ය වුවහොත් ඊට ගැලපෙන ලෙස සැක-සූ දර්ශක;
- දරිද්‍රතාවයට ගොදුරු වී ජීවත් වන පුද්ගලයන් වැනි බෙලහීන කණ්ඩායම්වල අත්දැකීම්;
- සාපේක්ෂව නිරීක්ෂණය කිරීමට අවකාශ සලසන දර්ශක;

## 2.5 ගැටුම් නිරාකරණ යාන්ත්‍රණ නිර්මාණය කිරීම

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ එක් ප්‍රධාන මූලධර්මයක් වන්නේ, පොලීසිය, තමන් විසින් සේවය සලසනු ලබන ප්‍රජාව සමග හවුල් වී ආරවුල් සහ ගැටුම් විසඳීමය. ඊට අතිරේකව ඔවුන්, විවිධ ප්‍රජාවන් තුළ පවතින ආරවුල් සහ ගැටුම්. සාමකාමී ලෙස විසඳිම සඳහා දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යුහයන් සමග සුදුසු අවස්ථාවලදී හවුල්වී ක්‍රියා කළ යුතුය. කෙසේ වෙතත් ප්‍රජාවන් තුළ පොලීසිය කෙරෙහි ඇති විශ්වාසයේ මට්ටම ගැනත්. මෙම විශ්වාසය තහවුරු වීම සඳහා කලක් ගත වනු ඇත යන්න ගැනත් ප්‍රතිසංස්කරණ කටයුතුවල නියැලෙන පුද්ගලයන් විසින් යථාර්ථවාදීව බැලිය යුතුය.

- තමන් කටයුතු කරමින් සිටින ප්‍රජාව සමග හවුල් වී ගැටළු විසඳීමටත්, ආරවුල් /ගැටුම් නිරාකරණය කිරීමටත් පොලීසියට හැකිවන ආකාරයේ යාන්ත්‍රණ හෝ ව්‍යුහයන්;
- ගැටුම් නිරාකරණය කිරීමේ සම්ප්‍රදායික මණ්ඩප වැනි යෝග්‍ය, වෙනත් ව්‍යුහයන් සහ මෙම යාන්ත්‍රණ අතර සම්බන්ධයක්;
- වෙනස්කම් ඇති කිරීමෙහි ලා මෙම යාන්ත්‍රණ කෙතරම් සාර්ථක වී ඇත් ද යන්න සහ ප්‍රජාවේ සාමය සහ ආරක්ෂාව උදෙසා එතුළින් අපේක්ෂිත බලපෑම සහ සැබවින්ම සිදුවී ඇති බලපෑම සමාලෝචනය කිරීම;

## අදියර 3:- ක්‍රියාවට නගන ආකාරය කළමනාකරණය කිරීම

ක්‍රියාත්මක කෙරෙන කාලය තුළ දී ප්‍රගතිය පිළිබඳව සැලකිලිමත්ව නිරීක්ෂණය කිරීම, අධීක්ෂණය නොකඩවා පෙරට ගෙන යාම සහ අවසාන ඉලක්ක ගැන පැහැදිලි ස්ථාවරයක සිටීම වැදගත්ය. ක්‍රියාවලිය තුළ අඩංගු සියළු පාර්ශවකරුවන්ගේ දායකත්වය ශක්තිමත් කිරීමේ සහ පුළුල් කිරීමේ මං සොයා යාම ද ක්‍රියාත්මක කිරීම තුළ සිදු විය යුතු ය. ක්‍රියාත්මක කිරීමේ අදියර සඳහා ඇතුළත් විය හැකි වැදගත් අංග වන්නේ :

### 3.1 නියමු ක්‍රියාකාරකම්

නියමු ක්‍රියාකාරකම් හෝ වැඩ සටහන් මහත් සේ ප්‍රයෝජනවත් විය හැකි නමුත්, ඒවා යථාර්ථවාදී සහ වෙනත් තැන්වලටද ආදේශ කළ හැකි විය යුතුය. නියමු ප්‍රදේශ හෝ ව්‍යාපෘති, පරීක්ෂණ මට්ටමේ ප්‍රවේශයන් සඳහා අවස්ථාවක් ලබා දෙන හෙයින්, අවශ්‍ය වුවහොත්, එය සංශෝධනය කිරීමට ද සාර්ථක වුවහොත් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඵලදායක කිරීමේ අවකාශය විශාල ලෙස වර්ධනය කිරීමටද, ඊට පුළුවන.

### 3.2 ජාතික සහ ප්‍රාදේශීය අධීක්ෂණ සහ සමාලෝචන ව්‍යුහයන්

ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම මෙහෙය වීමත්, සම්පත් භාවිතය නිරීක්ෂණය කිරීමත් පිණිස ජාතික සහ ප්‍රාදේශීය අධීක්ෂණ ව්‍යුහයන් ස්ථාපිත කළ යුතු ය. දැනට ක්‍රියාත්මකව පවතින ව්‍යුහයන් හඳුනා ගනු ලැබූ

අවස්ථාවලදී, ඒවා සමාලෝචනයකට ලක් කොට සුදුසු පරිදි භාවිත කළ යුතු ය. මෙම අධීක්ෂණ ව්‍යුහ තුළ පහත සඳහන් යාන්ත්‍රණ තිබිය යුතු ය.

- හුදු සංකේතාත්මක බලයක් නොව, සැබෑ බලයක් සහ ගැටළු විසඳීම සඳහා අවශ්‍ය බලාධිකාරිය;
- පැහැදිලි කාර්ය භාරයක් සහ වගකීම් බෙදීමක්;
- අධීක්ෂණ කටයුතු මෙහෙයවීම තුළ සිවිල් සහාගිත්වය;

## 3.3 වග වීමේ ව්‍යුහයන්

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ එක් ප්‍රධාන අරමුණක් නම්, පොලීසිය සහ මහ ජනතාව අතර විශ්-වසනීය සම්බන්ධතාවක් පෝෂණය කිරීමය. ප්‍රාදේශීය ප්‍රජාවගේ විශ්වාසය දිනා ගැනීමට නම්, පොලිස් සේවාව වෘත්තීයමය සහ ඵලදායක ලෙසින් ක්‍රියා කිරීම පමණක් නොව මහ ජනයාට වග වීමෙන් ක්‍රියා කරන පිරිසිදු, පැහැදිලි පොලීසියක් බවට පත් වීමද අවශ්‍ය ය. වග වීමේ ව්‍යුහයන් තුළ අඩංගු විය යුත්තේ :

- පොලීසිය, රජයට, පාර්ලිමේන්තුවට සහ මහ ජනයාට වග විය යුතු ලෙස ක්‍රියා කරවීමට සමත් ව්‍යුහයන්;
- මහ ජනයා සමග සෘජු සන්නිවේදන යාන්ත්‍රණ (නිදඃ ක්ෂණික ඇමතුම්, නිර්නාමික පැමිණිලි සේවය);
- පැමිණිලි පටිපාටි සහ යාන්ත්‍රණ කරා මහ ජනයාට පහසුවෙන් එළඹිය හැකි ක්‍රමයක්;
- අභ්‍යන්තර සමාලෝචන මණ්ඩල;
- වග වීමෙන් ක්‍රියා කිරීමේදී ව්‍යවස්ථාදායකයන්ගේ කාර්ය භාරය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා සැකසුණු අධ්‍යාපනික වැඩ සටහන් ( නිදඃ පාර්ලිමේන්තු කමිටු ව්‍යුහයන්,පළාත් /දිස්ත්‍රික් ව්‍යුහයන්);

## 3.4 පොලීසිය පුහුණු කිරීම සහ පුළුල් කිරීම හා සන්නිවේදන ශක්‍යතාව

ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තිරසාරව පවත්වා ගෙන යාම පිණිස ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව ක්‍රියාවට නැගීමට ප්‍රාදේශීය ප්‍රජාවේ සහ පොලිසියේ ඇති ශක්‍යතාව, ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා පොලීසියට සහ ප්‍රජාවට පුහුණු වීම් ලබා දීම සඳහා ප්‍රාදේශීය පුහුණු ආයතනවල ශක්‍යතාව වර්ධනය කිරීම මෙන්ම කණ්ඩායම් දෙකේම සිටින ප්‍රයෝජනවත් දක්ෂතා සහිත පුද්ගලයන් හඳුනා ගැනීමද කළ යුතු ය.

### පොලීසියට එහි ඇති වැදගත්කම :

- ප්‍රජාව පදනම්කර ගත් පොලිස් කටයුතු පිළිබඳ පුහුණුව; මෙය දැනට පවත්නා අධ්‍යාපන ව්‍යුහයන් සහ වැඩ සටහන් මගින් කළ හැකි නම් වඩාත් උචිතය;
- පුහුණු පාඨමාලාවලට අනතුරුව පසු විපරම් පුහුණුවක් ලබා දීම;
- මානව හිමිකම් ගරු කිරීමට සහ ආරක්ෂා කිරීමට පොලිසියේ ශක්‍යතාව වර්ධනය කිරීම;
- තොරතුරු යෝග්‍ය ආකාරයට සහ ඵලදායක ලෙස රැස් කර ගැනීමේ, කළමනාකරණය කිරීමේ සහ භාවිතයට ගැනීමේ පොලිසියේ ශක්‍යතාව ඉහළ නැංවීම;
- ක්ෂෙත්‍ර පුහුණුව සඳහා ජ්‍යෙෂ්ඨ ජාතික සහ / හෝ ජාත්‍යන්තර පොලිස් නිලධාරීන් මගින් පුහුණු කිරීම;

### සිවිල් සමාජයට/ප්‍රජාවට එහි ඇති වැදගත්කමඃ

- ආරක්ෂාව හා රැකවරණය සම්බන්ධව මහ ජනයාගේ කාර්ය භාරය හා වගකීම් පිළිබඳ දැනුවත් භාවයද, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව පිළිබඳ දැනුවත භාවය ද වර්ධනය කිරීම;
- මිනිසුන්ගේ නෛතික සහ මානව හිමිකම් ගැන ද ඔවුන්ගේ වගකීම් ගැන ද දැනුවත්
- භාවය වර්ධනය කිරීම;
- මූලික සංවිධානමය කුසලතා පිළිබඳව පුහුණුවක් අවශ්‍ය වුවහොත් ලබා දීම;

## 3.5 වෙනස් වීමේ වැඩ සටහනක් මෙහෙයවීම සහ කළමනාකරණය කිරීම සඳහා ශක්තිමත් ප්‍රාදේශීය ශක්‍යතාවක්

වෙනස් වීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට. මෙහෙයවීමට සහ කළමනාකරණය කිරීමට අදාල දේශයේ පාර්ශවකරුවන්ගේ ( පොලීසිය, රජය සහ සිවිල් සමාජය) හැකියා වර්ධනය කිරීම තුළින් ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ හැකියා වර්ධනය ශක්තිමත් කළ යුතු ය. මෙය ප්‍රතිසංස්කරණ වැඩ සටහන ක්‍රියාවට නැංවෙන මුළු කාලය පුරාම අඛණ්ඩව සිදු විය යුතු අතර පහත සඳහන් දෑ ඒ තුළ අඩංගු විය යුතු ය.

- වෙනස්කම් සිදු කිරීමේ වැඩ සටහන සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල රටේ පොලීසිය සහ ප්‍රජාවේ කුසලතා ශක්තිමත් කිරීම;
- වෙනස් කිරීමේ වැඩ සටහන සුදුසු අවස්ථාවලදී යළි සැලසුම් කිරීමට සහ සංශෝධනය කිරීම සඳහා අදාල පාර්ශවකරුවන්ට සහාය දැක්වීම;
- අත්දැකීම් සහ දැනුම හුවමාරු කර ගැනීමේ අරමුණින් යුතුව බාහිර / අන්තර් ජාතික උපදේශකවරුන් සමග ප්‍රධාන පොලිස් නිලධාරීන් ද දායක කර ගැනීම;
- මෙම ක්‍රියාවලියේ වැදගත් කොටසක් සිවිල් සමාජ ක්‍රියාකාරිකයන් සතු වන බවට වග බලා ගැනීම;

## 3.6 ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් සම්පත්

ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තිරසාර වීමට නම් ප්‍රමාණවත් තරම් මූල්‍ය සම්පත් ඒ සඳහා වෙන් විය යුතු අතර මෙම සම්පත් පොලිස් සේවයේ සාමාන්‍ය අය වැය තුළ අදාල ශීර්ෂ යටතට ඇතුළත් කළ යුතු ය. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ පරාසය ඒ ඒ ප්‍රදේශයට අනුව වෙනස් විය හැකිය. එහෙයින් ඊට සහාය දක්වන අන්තර් ජාතික ක්‍රියාකාරීන් හැකි තාක් දුරට මූල්‍ය තිරසාර භාවය ස්ථාපිත කිරීමට ඉලක්ක කළ යුතුය. එවිට ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සපුරාම අන්තර් ජාතික සම්පත් මත නොසිටිනු ඇති අතර ඒ අනුව ප්‍රතිග්‍රාහක රටේ සම්පත් භාවිතය උපරිම වශයෙන් සිදු කළ යුතු ය. තිරසාර ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් රැස් කර ගැනීම තුළට මතු සඳහන් දෑ ද ඇතුළත් ය :

- අන්තර් ජාතික සහයෝගය ඉක්ම ගිය පසු ක්‍රියාවලිය දිගු කලක් පුරා තිරසාරව පැවතීම සඳහා සුදුසු යාන්ත්‍රණ;
- සැබෑ අවශ්‍යතා සහ ප්‍රමුඛතා හඳුනා ගැනීමෙන් පසු ඒ මත පදනම් වූ අන්තර් ජාතික ද්‍රව්‍යමය සහයෝග ය;
- විවිධ මට්ටම්වලදී ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවීම තහවුරු කරනු වස් අරමුදල් හැකිතාක් දුරට විමධ්‍යගත කිරීම;

## 3.7 යෝග්‍ය සංවිධානමය ව්‍යුහය

අපේක්ෂා කළ ආකාරයේ පොලිස් සේවාවක් ක්‍රියාවට නැගීම සඳහා අවශ්‍ය ඉහළම ව්‍යුහයක් පොලිස් සංවිධානය තුළට හිමි වන බවට වග බලා ගැනීම, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහා සිදු විය යුතු ය. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා යෝග්‍ය සංවිධාන ව්‍යුහය තුළ අඩංගු විය යුතු ලක්ෂණ :

- ප්‍රජාව සමග කටයුතු කිරීමට ප්‍රාදේශීය පොලිස් නිලධාරීන්ට අවශ්‍ය බලතල;
- පැහැදිලි භූමිකාවක් සහ බලය පැවරීමක්;
- සිය දෛනික රාජකාරිය තුළ දී ප්‍රජාව පදනම් කර ගත් පොලිස් කටයුතුවල යෙදීමට පොලිස් නිලධාරීන් දිරි ගන්වනු වස් ත්‍යාග සහ සේවා ප්‍රතිලාභ;
- කළමනාකරණ කුසලතා;

## 3.8 කඩිනම් ජය

කඩිනම් ජය යන සංකල්පය මගින් දැක්වෙන්නේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ගමන් කරන දිශාව ගැන කලින්ම පෙන්වා දෙන ආකාරයේ සාධනීය වෙනස්කම් ය. සාර්ථකත්වය ක්‍රියාවලිය සඳහා දිරි දීම සහ තවත් වෙනස්කම් සහ ප්‍රතිසංස්කරණවලට අවශ්‍ය පදනම් සැපයීම, කඩිනම් ජය මගින් පිළිඹිබු වේ. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ සියළු අංශ කෙරෙහි විශ්වාසය තව දුරටත් ගොඩ නැගීම පිණිස සැබෑ සහ පැහැදිලිව පෙනෙන වෙනස්කම් කරා මග පෑදීම කඩිනම් ජය සංකල්පයේ අවශ්‍යතාවය වේ. මෙකී වෙනස්කම් විශාල පරාසයක පැතිරී යා හැකිය. නිදසුනක් වශයෙන් එය. දූෂණ කටයුතුවල නිරත ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමේ සිට, ආදර්ශ පොලිස් ස්ථාන ඇරඹීම දක්වා විහිදී යා හැකිය. ඒවා ස්ථාපිත කිරීම තුළින් ප්‍රජාව පදනම් කර ගත් ප්‍රවේශයක් පොලිස් කටයුතු සඳහා උපයෝගී කර ගැනීම මාර්ගයෙන් ලබා ගත හැකි සාධනීය බලපෑම් ප්‍රදර්ශනය කිරීමට අවකාශ සැලසී එතුළින් සමස්ථයක් වශයෙන් එකී ප්‍රවේශය සඳහා පුළුල් සහයෝගයක් ලැබෙනු ඇත. ආදර්ශ පොලිස් ස්ථානවලදී පරීක්ෂණයට භාජනය කරන ලද නව වැඩ සටහන් සෙසු ප්‍රදේශවල පිහිටි පොලිස් ස්ථාන වෙතට පතුරුවා ලීම ද අත්‍යවශ්‍ය ය.

## 3.9 නිරීක්ෂණ යාන්ත්‍රණ සහ ක්‍රියාදාමයන්

වෙනත් අවස්ථාවලදී හඳුනාගෙන ඇති අනෙකුත් ජාතික ප්‍රමුඛතා (නිදසුනක් වශයෙන් දරිද්‍රතාව අඩු කිරීමේ උපාය මාර්ග නිරීක්ෂණය කිරීමේ ලෝක බැංකු වැඩ සටහන් රාමුව තුළදී හඳුනා ගත්) කෙරෙහි නිරීක්ෂණ යාන්ත්‍රණ සහ ක්‍රියාදාමයන් විසින් අවධානය යොමු කළ යුතුය.

එම ක්‍රියාවලියේ අඩංගු විය යුතු ලක්ෂණ :

- සැලසුම්කරණ අදියරේදී තීරණය කරන ලද විශේෂ අවස්ථා සහ දර්ශක;
- ඉටු කරන ලද කටයුතු සහ උපාය මාර්ග, ඒවා- යේ ඇති යහපත් සහ අයහපත් භාවිතාවන් හඳුනා ගනිමින් සමාලෝචනය කිරීම;
- වෙනස් වීමේ ක්‍රියාවලියට තවත් සහයෝගය ලබා ගැනීමේ අටියෙන් යුතුව ජයග්‍රහණ සහ සාර්ථකත්වයන් ප්‍රචාරයට පත් කිරීමේ යාන්ත්‍රණ;
- සන්දර්භය ද, කාර්යය කෙරෙහි එහි බලපෑමද, එසේම සන්දර්භය කෙරෙහි කාර්යයේ බලපෑම ද, නිරීක්ෂණය කරනු පිණිස අඛණ්ඩ, යාවත්කාලීන අවදානම් සහ ගැටුම් විශ්ලේෂණ සිදු කිරීම;
- අන්තර් ජාතික ප්‍රජාවේ සහයෝගය ලැබ ප්‍රාදේශීය සිවිල් සමාජ කණ්ඩායම් විසින් නිරීක්ෂණය කිරීමේ කටයුත්ත ඉටු කිරීම;
- වෙනස් වීමේ ක්‍රියාවලියට වැඩිමනත් සහයෝගය ලබා ගැනීම පිණිස ජයග්‍රහණ හා සාර්ථකත්වයන් ප්‍රසිද්ධියට පත් කිරීම;

## 3.10 දූෂණයට එරෙහි වීම වර්ධනය කර වැඩ සටහන

දූෂණය මගින් නොකිලිටි වූ පොලීසියක් යනු වෙනස්කම් පිළිබඳ පැහැදිලි සංකේතයක් සහ මහජන විශ්වාසය ගොඩ නැගීමේ ප්‍රධාන අඩිතාලමක් වේ. කෙසේ වෙතත් දූෂණයට එරෙහි අරගලය ශක්තිමත් කිරීම දුෂ්කර ක්‍රියාවලියකි. එහි දී රජය සහ පොලීසිය පාර්ශවයෙන් බරපතල කැප වීමක් අවශ්‍ය වේ. එබැවින් ප්‍රතිසංස්කරණ කටයුතුවල යෙදෙන පුද්ගලයන් මේ පිළිබඳව යථාර්ථවාදී වීම අවශ්‍ය වේ. දූෂණය, සමහර විටකදී ආර්ථික වශයෙන් රැකී සිටීමේ පුළුල් සමාජ ගැටළුවක් සහ / හෝ නිශ්චිත සමාජයන්හිදී පිලිගත් සමාජ ධර්මයක් විය හැකිය. ඉන් කවර අවස්ථාවකදී වුවද දූෂණය පොලීසිය තුළින් පමණක් මකා දැමීම අතිශයින්ම දුෂ්කර වනු ඇත. සාර්ථක දූෂණ විරෝධී උපාය මාර්ගයක් පහත සඳහන් කරුණු වලින් සමන්විත විය යුතු ය.

- මනා කළමනාකරණය, අධීක්ෂණය සහ පාලනය;
- ප්‍රබල දූෂණ විරෝධී ප්‍රතිපත්තියක්;
- සාධාරණ සහ පාරදෘෂ්‍ය විනය පිලිවෙත් සහ විධි විධාන;
- දූෂණ විරෝධී ඒකකයක් සාර්ථකව මෙහෙයවීමට අවශ්‍ය හැකියාව සහ පුද්ගලික ගුණාංග සහිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට සහාය දීම;
- පැමිණිලි ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණ;

## 3.11 අභ්‍යන්තර සහ බාහිර සන්නිවේදනය

පොලිස් සේවාව වඩාත් පාරදෘෂ්‍ය භාවයෙන් සහ වග වීමෙන් යුතුව පවත්වා ගෙන යාම සඳහා ඉටු කිරීමේ ක්‍රියාවලිය මුළුල්ලේම මහ ජනතාව සමග පවත්වන අභ්‍යන්තර සහ බාහිර සන්නිවේදනය ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. සාර්ථක බාහිර සන්නිවේදනයක් යම් තාක් දුරකට පොලීසිය කෙරෙහි විශ්වාසය වැඩි කර ලීමට හේතු විය හැකිය. අසාර්ථකත්වයන් පමණක් වාර්තා කරනු ඇතැයි පවතින බිය නිසා ජනමාධ්‍ය යොදා ගැනීමට පොලීසිය පොදු අකමැත්තක් දක්වයි. එසේ වෙතත් පොලීසියේ බාහිර සන්නිවේදන උපාය මාර්ගයේ උපායික කොටස්කරුවකු වශයෙන් භාවිතා කළ හැකි ජනමාධ්‍ය සමග පොලීසිය සක්‍රීයව සබඳතා පැවැත්විය යුතුය. ජනමාධ්‍යවේදීන්ට පොලිස් සේවාවේ ඇති ගැටළු ගැන අවබෝධයක් ලබා දෙන අතරම, පොලීසිය ද ජන- මාධ්‍ය පුහුණුවක් ලැබිය යුතුය.

## අදියර 4:- ඇගයීම සහ ආපසු හැරීම

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා වැඩ සටහනක නි ෂ්ඨාව වන්නේ ජාත්‍යන්තර දායකත්වයේ සහයෝගය කින් තොරව තිරසාර ලෙස පෙරට යා හැකි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකි. මෙය සපුරා ගැනීමට නම් අන්තර් ජාතික ක්‍රියාකාරී භූමිකාව ක්‍රමානුකූලව අඩු වෙමින් දේශීය ක්‍රියාකාරිකයන් අතට බලතල වැඩි වැඩියෙන් ලැබෙන ආකාරයට. ඉටු කිරීමේ සැලැස්ම ඥාණාන්විතව ගොඩ නැගිය යුතුය. අන්තර් ජාතික ක්‍රියාකාරිකයන් ඉතා ඉක්මනින් පිටව ගිය අවස්ථාවලදී හෝ වගකීම් ඉතා සෙමෙන් පවරා දෙන අවස්ථාවලදී, බොහෝ පොලිස් ප්‍රතිසංස්කරණ පීඩාවට පත් වීමේ ප්‍රවණතාවය වලක්වා ගැනිමට මෙය උපකාරී වනු ඇත.

වැඩ සටහන තුළ එහි උපායික ඉලක්ක සහ අරමුණු සපුරා ගත හැකි වීද යන්න. විස්තරාත්මක ඇගයීමක් තුළින් තක්සේරු කර ගත හැකිය. කාර්යය - පූර්ව අදියරේ දී හඳුනා ගත් විශේෂ අවස්ථා සහ පැහැදිලි ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දර්ශක වැඩ සටහන් සැලැස්ම තුළට අන්තර්ගත කොට තිබේ නම් සහ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන නිමැවුම් හා ප්‍රතිඵල ගැන අඛණ්ඩ නිරීක්ෂණ සිදු කරමින් තිබේ නම්, එවිට තමන් ආපසු හැරී යා යුතු සුදුසු මොහොත පිලිබඳ පැහැදිලි අවබෝධයක් යමෙකු තුළ ඇතිවිය හැකිය.

සම්පූර්ණයෙන්ම දේශීය දෘෂ්ඨීන් භාවිතාවට යෙදවූ විට එය පුළුල් පරාසයක දෘෂ්ඨීන්ට ඉඩ පාදනු ඇති අතර ඇගයීමේ ප්‍රතිඵල වෙතට වැඩි සුජාත භාවයක් ද කටයුතු පෙරට ගෙන යාම සඳහා කරුණු ඉගෙනීමට දේශීය පාර්ශවකරුවන්ට වැඩි අවස්ථාවක් ද සලසා දෙනු ඇත. කාර්යය මූල්‍යමය විගණනයකට භාජනය කිරීම වැදගත් වේ. පොලීසිය තුළ සහ අන්තර් ජාතික සහයෝගය තුළින් ලද සම්පත් ප්‍රතිපාදනය මෙමගින් ඇගයීමට ලක් කල යුතු ය.

වෙනස් වීම් වැඩ සටහනේ මධ්‍ය කාලීන මට්ටමේ සිට දිගු කාලීන මට්ටම දක්වා පවතින බලපෑම් තක්සේරු කළ යුතු ය. ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව විසින් ආරක්ෂාව, රැකවරණය සහ සංවර්ධනය කෙරෙහි සිදු කරන බලපෑම ද ප්‍රජාවන් තුළ පවතින ගැටුම්වල මුල් හේතු සහ පෙර සිට පැවත ආ අවදානම් කෙරෙහි එමගින් කළ බලපෑමද මැන බැලිය යුතු ය.

තමන්ගේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය පවත්වා ගෙන යාමටත් තම වැරදිවලින් පාඩම් ඉගෙන ගැනීමටත් පොලීසියට හැකි විය යුතු අතර එවිට අන්තර් ජාතික සහයෝගය සිඳී ගිය විටක වුවත් මෙම ක්‍රියාවලින් පෙරට ගමන් කරනු ඇත. ක්‍රියාත්මක කිරීමේ අදියර තුළදී ස්ථාපිත කරන ලද අධීක්ෂණ සහ සමාලෝචන ව්‍යුහයන්හි හැකියාව වර්ධනය කිරීම වැදගත්ය.

අන්තර් ජාතික ආපසු හැරීම සම්පූර්ණ අවසානයක් නොවේ. ඒ වෙනුවට එය, ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා ක්‍රියාවලිය නිසි ආකාරයට පෙරට යන බව තහවුරු කර ගැනීම සඳහා විධිමත් කාලීන, සමාලෝචන පෙල ගැස්වීම සඳහා ගන්නා පියවරක් පමණි. තමන් විසින් අරඹන ලද ප්‍රතිසංස්කරණ ක්‍රුයාවලිය දැන් එම අන්තර් ජාතික ක්‍රියාකාරිකයන්ටම අමතකව ඇතැයි යන හැඟීම වැලක්වීමටද මෙය උපකාරි වේ. ක්‍රියාවලිය සඳහා ආධාර කණ්ඩායම්වල අඛණ්ඩ සහාය සහතික කිරීමේ මාර්ගයක් වශයෙන් ද වශයෙන් ද එය වැදගත් වේ.

අවසාන වශයෙන් කාර්යය මගින් උගත් පාඩම්, අනාගත කටයුතු සැලසුම් කිරීමේ දී යොදා ගනු වස්, බෙදා හැරීම අත්‍යවශ්‍ය ය. ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා වැඩ සටහන, සියළු පාර්ශවකරුවන් සහභාගි කර ගෙන පූර්ණ ලෙස සමාලෝචනයට ලක් කිරීම මගින්, සාර්ථක වූයේ කුමක් 'ද, එසේ නොවූයේ කුමක් ද යන්න පිළිබඳ වැදගත් පාඩම් උගත හැකිය. එසේම එබඳු පාඩම් සහ අත්දැකීම්, රට තුළ ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා කටයුතු පිළිබඳ පසු විපරම් වැඩ සටහන් සඳහාද, ක්‍රියාවලියට ආධාර කරන අන්තර් ජාතික ක්‍රියාකාරිකයන්ගේ පරිචය සඳහා ද ලබා දිය යුතුය.

## 7 සමාලෝචනය

ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවය, ආරක්ෂාවේ හා සංවර්ධනයේ ශක්තිය විය හැකිය. ප්‍රජාවගේ සහයෝගය ලබන, අනාරක්ෂිත භාවයට පිලියම් යෙදීමට සමත් පොලිස් බලයක් තුළින් දිගු කාලීන ආර්ථික, සමාජයීය, සහ දේශපාලන සංවර්ධනය කෙරෙහි කලක් පවතින බලපෑමක් සිදු විය හැකිය. කෙසේ වෙතත් අන්තර් ජාතික අත්දැකීම් තුළින් මෙතෙක් පෙන්නුම් කර ඇති ආකාරයට පොලිස් සංවිධානයක් ප්‍රතිසංවිධානය කිරීම, ඔවුන් පිලිබඳව ගිලිහී ගිය මහජන ප්‍රතිරූපය යලි පණ ගැන්වීම සහ ඔවුන්ගේ සේවා සැපයුම හේතුවෙන් නරක දේශපාලනික, මූල්‍යමය, ද්‍රව්‍යමය සහ ඓතිහාසික බාධකවලට ඊට මුහුණ පෑමට සිදු වෙයි. දිගු කාලීන සහ සාර්ථක ප්‍රතිසංස්කරණ සිදු කිරීමට නම් කළමනාකරණය නායකත්වය, දේශපාලන අධිෂ්ඨානය, සකස් වූ ආකල්ප, ආයතනගත හැසිරීම සහ නිශේධාත්මක මහජන ආකල්ප හා අදහස් පිලිබඳ ගැටළු ජය ගත යුතු ය. එහි හුදු සංකීර්ණත්වයම අයෙක් තැති ගන්වන තරම් ය.

කෙසේ වෙතත් එහි වැදගත්කම කෙතෙක් ද යත්, එය මග හැරිය හැකි ගැටළුවක් නම් නොවේ. ආයතනයක් වශයෙන් පොලීසියත් ඔවුන් විසින් සේවය සපයනු ඇතැයි අපේක්ෂිත ප්‍රජාව සමග ඔවුන්ගේ ඇති සම්බන්ධතාවයත් යන දෙඅංශයේම ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි සමාන ලෙස අවධානය යොමු කළ යුතු ආකාරය ගැනත්, එකී ප්‍රතිසංස්කරණ කටයුතු පැහැදිලිව අවබෝධ කරගත් දර්ශනයක් ප්‍රඥාවන්ත ලෙස සැකසූ සැලැස්මක් සහ මනා ලෙස සංවිධානය කොට කළමනාකරණය කල ඉටු කිරීමේ ක්‍රියාවලියක් මත රඳා පවත්නා බවත් වැඩ මුළුව විශේෂයෙන් අවධාරණය කලේය.

පොලිස් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඉදිරිපත් වන ක්‍රියාකාරිකයන්ගේ පරාසය පුළුල් වීමත් සමග එකී ප්‍රතිසංස්කරණ තුළ අඩංගු වන්නේ කුමක් ද යන්න සහ එම ප්‍රතිසංස්කරණ සිදු කල හැකි ආකාරය කුමක්ද යන්න ගැන පැහැදිලි වැටහීමක් පැවතිම තීරණාත්මකව වැදගත්ය. පුළුල් ප්‍රතිපත්ති සංවාද තුළ අන්තර්ගත ප්‍රජාව පදනම් කර ගත් පොලිස් ප්‍රතිසංස්කරණ සාකච්ඡාවලදී ද, එබඳු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කරන පුද්ගලයන්ට මග පෙන්වීමක් වශයෙන් ද මෙම කෘතිය ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව
# ආරක්ෂාව වර්ධනය කිරීම - වර්ධනය ආරක්ෂා කිරීම

### වැඩ මුළුවේ න්‍යාය පත්‍රය

| | |
|---|---|
| 9.00 - 9.30 | උදය ආහාර |
| 9.30 - 9.45 | පිළිගැනීමේ කථා<br>වේඩ් එම්. මැලෝනි, සභාපති, අන්තර් ජාතික සාම ඇකඩමිය<br>ඇලන් රොක්, එ.ජා.මණ්ඩලයේ කැනඩා නිත්‍ය නියෝජිත |
| සැසිය 1 | ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවය : ප්‍රධාන සංකල්ප සහ ක්‍රියාත්මක කිරීමේ අභියෝග |
| 9.45 -10.45 | හැඳින්වීම සහ දළ විශ්ලේෂණය<br>ආචාර්ය ගෝර්ඩන් පීක්, උපදේශක, අන්තර් ජාතික සාම ඇකඩමිය<br>ඉදිරිපත් කිරීම - ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවා දර්ශනය සහ මූලධර්ම පිළිබඳ කරුණු<br>ග්‍රැහැම් මතායස් මහතා, ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති උපදේශක, සේෆර්වර්ල්ඩ් |
| 10.45 -11.00 | තේ පානය |
| 11.00 -12.15 | ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව ක්‍රියාත්මක කිරීම (1) -පොලිස් කටයුතු සහ සිවිල් සමාජ දෘෂ්ඨී කෝණය<br>(මුලසුන : ගෝර්ඩන් පීක් )<br>මලාවි රාජ්‍යයේ උන්ඩුලේ ම්වකාසුන්ගුලා මහතා, මානව හිමිකම් සහ පුනරුත්ථාපනය පිළිබඳ මධ්‍යස්ථානය<br>සියෙරා ලියොන් රාජ්‍යයේ ඒඩ්‍රියන් හෝර්න් මහතා, හෝර්න් සමාගම<br>සර්බියා සහ මොන්ටෙනීග්‍රෝ රාජ්‍යයේ ආචාර්ය මාර්ක් ඩවුන්ස්, නීතිය සවි බල ගැන්වීමේ දෙපාර්තමේන්තුව, යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගිතාවය සඳහා වන සංවිධානය (OSCE) |
| 12.15- 1.15 | දිවා විවේකය |
| 1.15- 2.45 | ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව ක්‍රියාත්මක කිරීම (11) - ආධාර කණ්ඩායම් සහ එ.ජාතීන්ගේ දෘෂ්ඨී කෝණ<br>(මුලසුන : ඇන්ඩි මැක්ලීන් )<br>එමී ෆූරුයා මෙනවිය, විදේශ කටයුතු සහ අන්තර් ජාතික වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව (DFAIT )<br>ආචාර්ය කිරාන් බේඩි, පොලිස් උපදේශක, සිවිල් පොලිස් අංශය,<br>එ.ජා.සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුව (UNDPKO)<br>ආචාර්ය ඇන්ඩෲ මොරිසන්, දරිද්‍රතාවය සහ ස්ත්‍රී-පුරුෂ භාවය කණ්ඩායම, ලෝක බැංකුව |
| සැසිය 2 | |
| 2.45 - 3.30 | ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවයේ ආයතනික ආකෘතිය<br>( 1 ) ( මුලසුන : නෙක්ලා ත්ස්විර්ගි)<br>හිස් කාමරවල රුස්වීම් : පොලිස් ප්‍රතිසංස්කරණ තුළ මහජන අධීක්ෂණය සහ සහභාගිත්වය ශක්තිමත් කිරීම : උතුරු අයර්ලන්තයේ සිදුවීම<br>ආචාර්ය නීල් ජාර්මන්, ගැටුම් පර්යේෂණ ආයතනය, බෙල්ෆාස්ට්<br>නොකිය වූ වාර්තා, එරෙහි වූ නිර්දේශ : ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ වාසි ගැන පොලීසියට ඒත්තු ගැන්වීම<br>මහාචාර්ය ඔට්වින් මැරනින්, දේශපාලන විද්‍යා දෙපාර්තමේන්තුව / අපරාධ යුක්ති වැඩ සටහන, වොෂින්ටන් රාජ්‍ය විශ්ව විද්‍යාලය, |
| 3.30-3.45 | තේ පානය |
| 3.45-5.15 | ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාවේ ආයතනික ආකෘතිය,<br>( 11 ) (මුලසුන : ඇග්නස් හර්විට්ෂ් )<br>රාජ්‍ය පාලනය, පොලිස් ප්‍රතිසංස්කරණ සහ ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව<br>ආචාර්ය මාර්ක් බැස්කින් ජ්‍යෙෂ්ඨ උපදේශක, නිව් යෝර්ක් රාජ්‍ය විශ්ව විද්‍යාලය, අන්තර් ජාතික සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානය සහ මහජන ප්‍රතිපත්ති උපදේශක, වුඩ්රෝ විල්සන් මධ්‍යස්ථානය<br>නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාව පදනම් කර ගත් පොලිස් සේවාව<br>ක්‍රිස් ගේල් මහතා, උපදේශක, අන්තර් ජාතික සංවර්ධනය පිළිබඳ දෙපාර්තමේන්තුව, (DFID), UK එ.ජාතීන්ගේ සාම මෙහෙයුම්වල සිවිල් පොලිස් කටයුතු<br>ආචාර්ය රෙනාටා ඩ්වේන්, ස්ටොක්හෝල්ම් ජාත්‍යන්තර සාම පර්යේෂණ ආයතනය ( SIPRI ) |
| 5.15-5.30 | සමාප්ත සටහන්<br>ඇන්ඩි මැක්ලීන් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, සේෆර්වර්ල්ඩ්<br>ආචාර්ය නෙක්ලා ත්ස්විර්ගි, උප සභාපති, අන්තර් ජාතික සාම ඇකඩමිය |

# සහභාගි වූවන්ගේ නාම ලේඛනය

ආචාර්ය මාර්ක් බැස්කින්,
වුඩ්රෝ විල්සන් මධ්‍යස්ථානය, ප්‍රින්ස්ටන් විශ්ව විද්‍යාලයය

ආචාර්ය කිරාන් බේඩ්
එ.ජා.සාම සාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුව
සිවිල් පොලිස් අංශය

කහා විටයියා මහතා
එ.ජා. ජෝර්ජියානු ස්ථාවර දූත මණ්ඩලය

ආචාර්ය මාර්ක් ඩවුන්ස්
යුරෝපයේ ආරක්ෂාව සහ සහයෝගය සඳහා සංවිධා-නය
සර්බියා සහ මොන්ටෙනීග්‍රෝ දූත මණ්ඩලය

ආචාර්ය රෙනාටා ඩ්වේන්
ස්ටොක්හෝල්ම් අන්තර් ජාතික සාම පර්යේෂණ ආයතනය

එමී ෆුරුයා මෙනෙවිය
විදේශ කටයුතු සහ අන්තර් ජාතික වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව

ක්‍රිස් ගේල් මහතා
උපදේශක

ඇන්ඩ්‍රියා ගුඩ්මන් මෙනෙවිය
එ.ජා. සංවර්ධන වැඩ සටහන, අර්බුද වැළැක්වීම සහ ප්‍රති නිර්මාණ බියුරෝව

හෙස්ටා ග්‍රෝන්වෝල්ඩ් මෙනෙවිය
සේෆර්වර්ල්ඩ්

ලුඩොවික් හුඩ් මහතා
එ.ජා. සංවර්ධන වැඩ සටහන

ඒඩ්‍රියන් හෝර්න් මහතා
හෝර්න් සමාගම

ජීන්-මාර්ක් හොස්විට් මහතා
එ.ජා. ලක්සෙම්බර්ග් නිත්‍ය දූත මණ්ඩලය

ලුතිනන් කර්නල් කෙන්. ජේ. ඩී. හියුම්
එ.ජා. එක්සත් රාජධානියේ නිත්‍ය දූත මණ්ඩලය

ආචාර්ය ඇග්නස් හර්විට්ෂ්
අන්තර් ජාතික සාම ඇකඩමිය

ආචාර්ය නීල් ජාර්මන්
ගැටුම් පර්යේෂණ ආයතනය
ඔමාන් කෝන් මහතා
එ.ජා. ලක්සෙම්බර්ග් නිත්‍ය දූත මණ්ඩලය

ඩේවිඩ් මැලෝන් මහතා
අන්තර් ජාතික සාම ඇකඩමිය
ආචාර්ය ඔට්වින් මැරනින්
දේශපාලන විද්‍යා දෙපාර්තමේන්තුව, වොෂින්ටන් රාජ්‍ය විශ්ව විද්‍යාලයය
වොෂින්ටන්

ග්‍රැහැම් මතායස් මහතා
සේෆර්වර්ල්ඩ්

ඇන්ඩි මැක්ලින් මහතා
සේෆර්වර්ල්ඩ්

ජෝ මොයර් මෙනෙවිය
එ. ජා. එක්සත් ජනපද නිත්‍ය දූත මණ්ඩලය

ආචාර්ය ඇන්ඩෲ මොරිසන්
ලෝක බැංකුව

රිචර්ඩ් මෝසස් මහතා
එ. ජා. ඔස්ට්‍රේලියානු නිත්‍ය දූත මණ්ඩලය

උන්ඩුලේ ම්වකාසුන්ගුලා මහතා
මානව හිමිකම් සහ පර්යේෂණ මධ්‍යස්ථානය

රචෙල් නීල්ඩ් මෙනෙවිය
උපදේශක

ඩැග් හැල්වොර් නයිලැන්ඩර් මහතා
එ.ජා. නෝර්වේ නිත්‍ය දූත මණ්ඩලය

හෙයිකෝ නීට්ෂ්කේ මහතා
අන්තර් ජාතික සාම ඇකඩමිය

ආචාර්ය ගෝර්ඩන් පීක්
අන්තර් ජාතික සාම ඇකඩමිය

ඇලන් රොක් මහතා
එ.ජා. කැනඩා නිත්‍ය දූත මණ්ඩලය

මාර්ක් රොජර්ස් මහතා
උපදේශක

කර්නල් ජස්සි සරෙසාලෝ
අන්තර් ජාතික සාම ඇකමිය

නොරිමාසා සිමොමුරා මහතා
එ. ජා. සංවර්ධන වැඩ සටහන

ෆ්ලේවියස් ස්ටෑන් මහතා
අන්තර් ජාතික සාම ඇකඩමිය

කේසී ස්ටුඩාර්ඩ් මෙනෙවිය
අන්තර් ජාතික සාම ඇකඩමිය

කමාන්ඩර් හකාන් තේලින්
එ. ජා. ස්වීඩන් නිත්‍ය දූත මණ්ඩලය

ආචාර්ය නෙක්ලා ත්ස්විර්ගි
අන්තර් ජාතික සාම ඇකඩමිය

ලුක් වැන් ඩි ගෝර්
ජාත්‍යන්තර සබඳතා පිළිබඳ නෙදර්ලන්ත ආයතනය
ක්ලින්ජෙන්ඩාල්

මේජර් නීල්ස් හෙන්රික් වූග්ස්බෝර්ග්
එ.ජා. ඩෙන්මාර්ක් නිත්‍ය දූත මණ්ඩලය

International Peace Academy
777 United Nations Plaza
New York, NY 10017-3521
Tel: (212) 687-4300
Fax: (212) 983-8246
www.ipacademy.org

Saferworld
28 Charles Square
London N1 6HT UK
Tel: +44 (0) 207324 4646
Fax: +44 (0) 207324 4647
www.saferworld.org.uk